සැ. යු.- මෙම අති විශේෂ ගැසට් පත්‍රයෙහි දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1992/16 - 2016 නොවැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2016.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත

4 (2) වගන්තිය යටතේ පළකිරීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS සහ LKAS) 2016 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මක වෙනස්වීම් සම්මත කර 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිත පනතේ අරමුණු සඳහා මේ සමග පළකරමි. මෙම සංශෝධන දෙදහස් දහසයේ ජනවාරි මස පළමුවැනි දින හෝ ඊට පසු ආරම්භ වන කාල පරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ. ඊට පෙර ව්‍යවහාරකරණය සඳහා අවසර දේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල 2016 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන වෙනස්වීම්

## පටුන

[1] මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුව
[2] SLFRS 1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) මුල් වරට සම්මත කර ගැනීම
[3] SLFRS 2 - කොටස් පදනම් ගෙවීම්
[4] SLFRS 3 - ව්‍යාපාර සංයෝජන
[5] SLFRS 4 - රක්ෂණ ගිවිසුම්
[6] SLFRS 5 - විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්
[7] SLFRS 6 - ඛනිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම්
[8] SLFRS 7 - මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම
[9] SLFRS 8 - මෙහෙයුම් ඛණ්ඩ
[10] SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
[11] SLFRS 11 - බද්ධ සැකසුම්
[12] SLFRS 12 - සම්බන්ධිත වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම
[13] SLFRS 13 - සාධාරණ අගය මැනීම
[14] SLFRS 14 - නියාමන විලම්බන ගිණුම්
[15] LKAS 1 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම
[16] LKAS 2 - තොග
[17] LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය
[18] LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි
[19] LKAS 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්
[20] LKAS 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
[21] LKAS 12 - ආදායම් බදු
[22] LKAS 16 - දේපල, පිරියත හා උපකරණ
[23] LKAS 17 - කල්බදු
[24] LKAS 18 - අයභාරය
[25] LKAS 19 - සේවක ප්‍රතිලාභ
[26] LKAS 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය හා රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම
[27] LKAS 21 – විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්වීම්වල බලපෑම්
[28] LKAS 23 - ණය ගැනුම් පිරිවැය
[29] LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම
[30] LKAS 26 - විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය
[31] LKAS 27 - වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන
[32] LKAS 28 - ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජනයන්
[33] LKAS 29 - අධි උද්ධමනකාරී ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය
[34] LKAS 32 - මූල්‍ය සාධනපත්‍ර : ඉදිරිපත් කිරීම
[35] LKAS 33 - කොටසක ඉපැයුම්
[36] LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය
[37] LKAS 36 - වත්කම් හානිකරණය
[38] LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්
[39] LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්
[40] LKAS 39 - මූල්‍ය සාධන පත්‍ර : හඳුනාගැනීම සහ මැනීම
[41] LKAS 40 - ආයෝජන දේපළ
[42] LKAS 41 - කෘෂිකර්මය

## මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව

වෙනස්කම් නොමැත.

## LKAS 1 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| 10 (ඉ) | **....පැහැදිලි කිරීමේ තොරතුරු, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුලත් සටහන්** |
| 30 (අ) | අස්තිත්වයක් විසින් මෙය සහ අනෙකුත් SLFRSs අනුගමනය කිරීමේදී අදාල සියළු කරුණු සහ සිද්ධීන් සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් තොරතුරු සමාහරණය කරන්නේ කෙසේද, සටහන්වල ඇතුලත් වන්නේ කුමක්ද යන්න ඇතුළුව තීරණය කළයුතුය. අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක තොරතුරු, අප්‍රමාණාත්මක තොරතුරු සමඟ සංකලනය කිරීමෙන් හෝ විවිධ ස්වභාවයේ හෝ කාර්යයන්ගෙන් යුතු ප්‍රමාණාත්මක අයිතම සමාහරණය කිරීමෙන් එහි මූල්‍ය ප්‍රකාශන අවබෝධකර ගැනීමේ හැකියාව අඩු නොකළ යුතුය. |
| 31 | සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කිරීම අවශ්‍ය කෙරෙන තොරතුරු සමහර SLFRSs මඟින් විශේෂයෙන් නියම කර ඇත. එලෙස SLFRSs මඟින් විශේෂිත හෙළිදරව් කිරීමක් ලෙස දැක්විය යුතු ලෙසට උපදෙස් දී ඇති තොරතුරු හෙළිදරව් කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ප්‍රමාණවත් නොවන්නේ නම් අස්තිත්වයක් විසින් එවැනි විශේෂිත හෙළිදරව්කිරීම් සිදුකිරීම අවශ්‍ය නොවේ. SLFRSs එවැනි විශේෂිත අවශ්‍යතාවයන් ලැයිස්තුවක් ඇතුලත් කර තිබෙන විට හෝ අවම හෙළිදරව් කිරීම් ලෙස විස්තර කර ඇති විටදී වුවද මෙය අදාල වේ. අස්තිත්වයක් විසින් SLFRSs විශේෂිතව උපදෙස් දී ඇති හෙළිදරව්කිරීම් වලට අනුගතවීම් තුලින් මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට අදාල ගණුදෙනුවල හෝ අනෙකුත් සිද්ධි හෝ තත්ත්වයන් අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි වන බලපෑම අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් නොවේනම් අතිරේක හෙළිදරව්කිරීම් සිදුකල යුතු වන්නේද යන්න පිළිබඳව ද සළකා බැලිය යුතුය. |
| 54 | **මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ පහත අගයන් දැක්වෙන ජේලි අයිතම් ඇතුලත් කළයුතුයඃ** |
| 54(ඊ) | **LKAS 41- කෘෂිකර්මය විෂය පථයට ඇතුලත් වන ජීව විද්‍යාත්මක වත්කම්** |
| 55 | **අස්තිත්වයක් විසින් අතිරේක ජේලි අයිතම (54 ඡේදයෙහි ලැයිස්තුගත කර ඇති ජේලි අයිතම් ඇතුලත් කර නොමැති) මාතෘකා සහ උප එකතූන් අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට අදාල වන්නේ නම් ඒවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කළයුතුය.** |
| 55(අ) | **අස්තිත්වයක් විසින් 55 වන ඡේදයට අනුකූලව උප එකතූන් ඉදිරිපත් කරන විට එම උප එකතූන් :**<br>**(අ) SLFRS සමඟ අනුකූල වන පරිදි හඳුනාගත් සහ මැනුම් කළ ජේලි අයිතමයන්ගෙන් සමන්විත වියයුතුයඃ**<br>**(ආ) ජේලි අයිතමයන්ගෙන් සෑදෙන උප එකතූන් පැහැදිලිව සහ අවබෝධ කරගත හැකිවන පරිදි ලාංඡන කර ඉදිරිපත් කළයුතුයඃ**<br>**(ඇ) ඡේද අංක 45ට අනුකූල වන පරිදි කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට සංගත විය යුතුයඃ සහ**<br>**(ඈ) SLFRS මඟින් උපදෙස් දී ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි එකතුවට වඩා වැඩි ප්‍රමුඛතාවයක් ලැබෙන පරිදි උප එකතූන් සහ එකතූන් ප්‍රදර්ශනය නොකළ යුතුය.** |
| 82(අ) | **කාලපරිච්ඡේදයට අදාලව ඉදිරිපත් කළයුතු ජේලි අයිතමයන්හි අගයන් වෙනත් විස්තීර්ණ ආදායම් කොටසේඃ**<br>**(අ) වෙනත් විස්තීර්ණ ආදායම් කොටසේ අයිතම් ((ආ) ඡේදයෙහි ඇතුලත් අගයන් හැර) අනෙකුත් SLFRSs සමඟ අනුකූල වන පරිදි ස්වභාවය සහ අයත්වන කණ්ඩායම් අනුව වර්ග කළයුතුයඃ**<br>**(i) පසුව ලාභය හෝ අලාභය ලෙස යලි වර්ගීකරණය සිදු නොකළ යුතු; සහ**<br>**(ii) විශේෂිත කොන්දේසි සපුරා ඇතිවිට පසුව ලාභය හෝ අලාභය ලෙස යලි වර්ගීකරණය කළයුතු.** |

| | |
|---|---|
| | **(ආ) ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කර ඇති ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරයන්හි වෙනත් විස්තීර්ණ ආදායමේ කොටස අනෙකුත් SLFRSs සමඟ අනුකූල වනසේ අයිතම් කොටස් වෙන්කළ යුතුය:**<br>(i) **පසුව ලාභය හෝ අලාභය ලෙස යළි වර්ගීකරණය සිදු නොකළ යුතු; සහ**<br>(ii) **විශේෂිත කොන්දේසි සපුරනු ලැබූවිට පසුව ලාභය හෝ අලාභය ලෙස යළි වර්ගීකරණය කළයුතු.** |
| 85 | **අස්තිත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය අවබෝධ කර ගැනීමට අදාල වන විටදී අස්තිත්වය විසින් අතිරේක පේළි අයිතම් (ඡේද 82 හි ඇතුලත් පේළි අයිතම ලැයිස්තුවෙහි එකතු නොකරනලද පේළි අයිතම් ඇතුළු කිරීමෙන්), ශීර්ෂ සහ උප එකතුන් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ඉදිරිපත් කළයුතුය.** |
| 85(අ) | ඡේද 85ට අනුකූල වන පරිදි, අස්තිත්වයක් විසින් උප එකතු ඉදිරිපත් කිරීමේදී එම උප එකතුන්:<br>(අ) SLFRS වලට අනුකූල වන පරිදි හඳුනාගත් හා මැනුම් කළ පේළි වලින් සමන්විත වියයුතුය:<br>(ආ) පේළි අයිතමයන්ගෙන් සෑදෙන උප එකතුන් පැහැදිලිව සහ අවබෝධ කරගත හැකිවන පරිදි ලාංඡන කර ඉදිරිපත් කළයුතුය:<br>(ඇ) ඡේද අංක 45ට අනුකූල වන පරිදි කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට සංගත විය යුතුය: සහ<br>(ඈ) SLFRS මඟින් උපදෙස් දී ඇති පරිදි ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙ(න්)හි ඉදිරිපත් කර ඇති ආකාරයට වඩා වැඩි ප්‍රමුඛතාවයක් ලැබෙන පරිදි උප එකතුන් සහ එකතුන් ප්‍රදර්ශනය නොකළ යුතුය: |
| 85(ආ) | අස්තිත්වයක් විසින් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි(යන්හි) පේළි අයිතම් ඉදිරිපත් කිරීමේදී එම ප්‍රකාශනය(න්) ඡේද85ට අනුකූලව උප එකතු හෝ එකතුන් සැසඳීම් SLFRS නිර්ණායකයන්ට අනුව ඉදිරිපත් කළයුතුය. |
| 113 | **අස්තිත්වයක් විසින් හැකිතාක් දුරට ප්‍රායෝගිකව සටහන් ක්‍රමානුකූල ආකාරයෙන් ඉදිරිපත් කළයුතුය. ක්‍රමානුකූල ආකාරයක් තීරණය කිරීමේදී, එහි මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම සහ සැසඳිය හැකි භාවය කෙරෙහි ඇතිවන බලපෑම අස්තිත්වය විසින් සැලකිලිමත් විය යුතුය. අස්තිත්වය විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය(න්) සහ අස්තිත්වයේ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයන්හි ඇති සටහන්වල ඇතුලත් ඕනෑම සම්බන්ධිත තොරතුරක් පිළිබඳව හරස් යොමු තැබිය යුතුය.** |
| 114 | සටහන්වල ක්‍රමානුකූල අනුපිළිවෙලට දැක්වීම හෝ කාණ්ඩ කිරීම සඳහා උදාහරණ වලට:<br>(අ) අස්තිත්වය විසින් එහි මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව අවබෝධ කර ගැනීමට වඩාත් අදාල වන මෙහෙයුම් ක්‍රියාකාරකම් කොටස් වලට අදාල තොරතුරු එකට වර්ගීකරණය කිරීම සඳහා ප්‍රමුඛත්වයක් දීමට සැලකිලිමත් වීම:<br>(ආ) සාධාරණ අගයට මනින ලද වත්කම් වැනි සමාන ලෙස මනිනු ලබන අයිතමයන්හි තොරතුරු එකට වර්ගීකරණය කිරීම: නැතහොත්<br>(ඇ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන(යන්) සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති පේළි අයිතම් පහත දැක්වෙන අනු පිළිවෙලට ගතයුතුය:<br>(i) SLFRSs වලට අනුකූලතාවීමේ ප්‍රකාශය (ඡේද 16 බලන්න);<br>(ii) භාවිතා කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඡේද 117 බලන්න);<br>(iii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන(ය) සහ ස්කන්ධය වෙනස්වීම් සහ මූල්‍ය ප්‍රවාහ යන ප්‍රකාශනයන්හි ඉදිරිපත් කර ඇති අයිතමයන් සඳහා වන ආධාරක තොරතුරු සහ අයිතයමය ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලට; සහ<br>(iv) පහත සඳහන් අනෙකුත් හෙළිදරව් කිරීම් ඇතුළුව එක් එක් ප්‍රකාශය හා පේළි:<br>(1) අසම්භාව්‍ය වගකීම් (LKAS 37 බලන්න) සහ හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්; සහ |

| | |
|---|---|
| | (2) මූල්‍ය නොවන හෙළිදරව් කිරීම්, උදාහරණ: අස්තිත්වයේ මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ හා ප්‍රතිපත්ති (SLFRS 7 බලන්න). |
| **115** | [ඉවත් කරන ලදී]. |
| **117** | **අස්තිත්වයක් විසින් එහි සැළකියයුතු අන්දමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් දෑ අඩංගු කරමින් හෙළිදරව් කළයුතුය:** |
| **119** | යම්කිසි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හෙළිදරව් කළයුතුද යන්න තීරණය කිරීමේදී එම හෙළිදරව්කිරීම තුළින් පරිශීලකයන්ට වාර්තාකර ඇති මූල්‍ය කාර්ය සාධනයේ සහ මූල්‍ය තත්ත්වයෙහි ගණුදෙනු වෙනත් සිදුවීම් හා තත්ත්වයන් පිළිබිඹු කර ආකාරය අවබෝධ කර ගැනීමට උපකාර වන්නේද යන්න පිළිබඳව කළමනාකාරිත්වය විසින් සලකා බැලිය යුතුය. සෑම අස්තිත්වයක් විසින්ම එහි මෙහෙයුම්වල ස්වභාවය සහ මෙම වර්ගයේ අස්තිත්වයන්හි මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන අය විසින් හෙළිදරව් කරනු ඇතැයි අපේක්ෂා කරන හෙළිදරව්කිරීම් ගැන සලකා බලයි. SLFRSs මගින් ඉඩදී ඇති විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්ති අතුරින් ප්‍රතිපත්තියක් තෝරා ගැනීම සිදුකර ඇති අවස්ථාවන්හි දී එම විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව්කිරීම පරිශීලකයින්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් වේ. උදාහරණයක් ලෙස අස්තිත්වයක් විසින් එහි ආයෝජන දේපල ඇගයීම සඳහා සාධාරණ අගය පදනම නැතහොත් පිරිවැය ආකෘතිය අදාල කර ගන්නේද යන්න හෙළිදරව්කිරීම දැක්විය හැක. (LKAS 40 *ආයෝජන දේපල* ප්‍රමිතිය බලන්න.) ප්‍රමිත වලින් ඉඩදී ඇති විවිධ ප්‍රතිපත්ති අතුරින් කළමනාකාරිත්වය විසින් තෝරාගෙන ඇති ඒවා ඇතුළුව විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කිරීම සමහර SLFRSවලින් විශේෂයෙන් අවශ්‍ය කෙරේ. උදාහරණ වශයෙන්, LKAS 16 මගින් දේපල, පිරියත හා උපකරණ පන්ති මැනුම්කරණ පදනම් හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ. |
| **120** | [ඉවත් කරන ලදී]. |
| **122** | **අස්තිත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කිරීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් අගයන් කෙරෙහි වඩාත් සැළකිය යුතු අන්දමේ බලපෑමක් ඇති කරන ඇස්තමේන්තු කිරීම් ඇතුලත් ඒවා හැරුනු විට (125 ඡේදය බලන්න.) කළමනාකරණය විසින් කරන ලද විනිශ්චයන්, සැලකියයුතු අන්දමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ අනෙකුත් සටහන් සමඟ අස්තිත්වය විසින් හෙළිදරව් කළයුතුය.** |
| **139ජ** | 2015 මාර්තු මස නිකුත් කරන ලද *ආරම්භක හෙළිදරව්කිරීම* (LKAS 1ට සංශෝධන), සංශෝධිත ඡේද අංක10, 31, 54-55, 82අ, 85, 113-114,117,119 සහ 122, එකතු කරන ලද ඡේද 30අ, 55අ සහ 85අ-85ආ සහ ඉවත් කරන ලද ඡේද115 සහ 120. අස්තිත්වයවක් විසින් එම සංශෝධනයන් 2016 ජනවාරි මස 01 වන දිනෙන් හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තා කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාර කිරීම සඳහා අවසර තිබේ. අස්තිත්වයන් විසින් LKAS 8 හි ඡේද 28-30න් හෙළිදරව් කළයුතු ලෙස උපදෙස් දී ඇති තොරතුරු මෙම සංශෝධන සම්බන්ධයෙන් හෙළිදරව්කිරීම අවශ්‍ය නොකෙරේ. |

## LKAS 2 - තොග

වෙනස්කම් නොමැත.

## LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශ

වෙනස්කම් නොමැත.

## LKAS 8- ගිණුම්කරණ ප්‍රතිපත්ති: ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි

වෙනස්කම් නොමැත.

## LKAS 10- වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වෙනස්කම් නොමැත.

## LKAS 11- ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

වෙනස්කම් නොමැත.

## LKAS 12- ආදායම් බදු

වෙනස්කම් නොමැත.

## LKAS 16 -දේපල, පිරියත හා උපකරණ

| | |
|---|---|
| 3 (ආ) | ධාරණ වගාවන් හැරුණුවිට කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වූ ජීව විද්‍යාත්මක වත්කම් - (LKAS 41 කෘෂිකර්මය බලන්න.) <u>මෙම ප්‍රමිතිය ධාරණ වගාවන් සඳහා අදාල වන නමුත් ධාරණ වගාවන්හි නිෂ්පාදන සඳහා අදාල නොවේ.</u> |
| 6 | පහත දැක්වෙන පද නිශ්චිතව දක්වා ඇති තේරුම් සහිතව මෙම ප්‍රමිතියේ භාවිතාවේ:<br><br><u>ධාරණ වැවිල්ලක් යනු:</u><br><br>(අ) <u>කෘෂිකාර්මික නිෂ්පාදන නිෂ්පාදනයේදී හෝ නිෂ්පාදන සැපයීමේදී යොදාගන්නා:</u><br><br>(ආ) <u>නිෂ්පාදන ඵලදාව වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල ලැබෙතැයි අපේක්ෂා කරන: සහ</u><br><br>(ඇ) <u>අහඹු සුන්බුන් අලෙවිය හැරුණු මේවා කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලෙස විකිණීමට ඇති හැකියාව ඉතා විරල වන සජීවී වැවිල්ලකි.</u><br><br><u>(LKAS 41 ඡේද5අ5 ආ මඟින් ධාරණ වැවිල්ලක් පිළිබඳ නිර්වචනය විස්තර වශයෙන් පැහැදිලි කර ඇත).</u><br><br>වත්කමක ධාරණ අගය යනු එහි යම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරන අලාභ අඩුකළ පසු වත්කමක් හඳුනාගනු ලබන අගයයි.<br><br>පිරිවැය යනු වත්කමක් අත්පත් කරගත් හෝ ඉදිකරන අවස්ථාවේ එය අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද මුදල් හෝ මුදල් හා සමාන දෑ වල ප්‍රමාණය හෝ දෙන ලද වෙනත් ප්‍රතිෂ්ඨාවක සාධාරන වටිනාකම හෝ අදාළ තන්හි වෙනත් SLFRS වල නිශ්චිත අවශ්‍යතා අනුව වත්කමක් මුල්වරට හඳුනාගන්නා ලද අවස්ථාවේ එම වත්කමට ආයෝජනය කරන ලද අගයයි. උදාහරණ, SLFRS 2 කොටස් පදනම්වූ ගෙවීම.<br><br>ක්ෂය කළහැකි අගය යනු වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය සඳහා ආදේශකයක් වූ වෙනත් අගයකින් එහි අවශේෂ අගය අඩු කිරීමෙන් පසු ලැබෙන අගයයි.<br><br>ක්ෂයවීම් යනු වත්කමෙහි ක්ෂය කළහැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල ලෙස බෙදා හැරීමය.<br><br>අස්තිත්ව විශේෂ වටිනාකම යනු වත්කමක් අඛන්ඩව පාවිච්චි කිරීමෙන් හා එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානයේ බැහැර කිරීමේදී ලැබෙන හෝ වගකීමක් නිරවුල් කිරීමේදී දැරිය යුතු මුදල් ප්‍රවාහවල වර්තමාන අගයයි.<br><br>සාධාරණ අගය යනු මනිනු ලබන දින වෙළඳපොළ සහභාගිවන්නන් අතර සාමාන්‍යයෙන් සිදුවන ගණුදෙනුවකදී වත්කමක් විකිණිමෙන් ලැබෙන මිල හෝ වගකීමක් බේරුම් කිරීම සඳහා ගෙවියයුතු මුදල වේ. (SLFRS 13 සාධාරණ අගය මැනුම්කරණය බලන්න.)<br><br>හානිකරණ අලාභය යනු වත්කමක අයකර ගතහැකි අගය ඉක්මවන ධාරණ අගයයි. |
| 22 අ | <u>තමන් විසින්ම ඉදිකළ දේපල, පිරියත හා උපකරණ අයිතමයක් කළමනාකරණය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියාකළ හැකි තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒමට පෙර ක්‍රියාකාරකම් ගිණුම්කරණය කරන ආකාරයට ධාරණ වගාවන් ගිණුම්ගත කිරීම ද සිදුකෙරේ. මෙහි ප්‍රතිඵලයක් මෙම ප්‍රමිතියෙහි ''ඉදිකිරීම්''යන සඳහන කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියාකළ හැකි තත්ත්වයට හා</u> |

| | |
|---|---|
| | ස්ථානයට ගෙන ඒමට පෙර ධාරණ වගාවන් වගා කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් ආවරණය වන අයුරින් කියවිය යුතුය. |
| 37 (i) | ධාරණ වගාවන්. |
| 56 (ඇ) | නිෂ්පාදනයේ ඇතිවන වෙනස්කම් හෝ වැඩිදියුණුකිරීම් හෝ වත්කමේ නිෂ්පාදන හෝ සේවා නිමැවුම සඳහා වූ වෙළඳපොලේ ඉල්ලුමේ වෙනස්වීම් වලින් පැන නගින තාක්ෂණික හෝ වාණිජ යල් පැනීම්. යම් වත්කමක් භාවිතාකර නිෂ්පාදනය කළ යම් අයිතමයක විකුණුම් මිල අනාගතයේදී අඩුවේ යයි කෙරෙන අපේක්ෂාව මගින් එම වත්කමේ අපේක්ෂිත තාක්ෂණික හෝ වාණිජ යල් පැනීම් අපේක්ෂාවක් පෙන්නුම් කළහැකි අතර ඒ අනුව එය පෙරලා වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ අඩුවීමද පිළිබිඹු විය හැකිය. |
| 62 අ | වත්කමක පාවිච්චිය අන්තර්ගත වනයම් ක්‍රියාකාරකමකින් ජනිත වන ආදායම පදනම්ව ක්ෂය ගණනය කරන ක්‍රමයක් යෝග්‍ය නොවේ. වත්කමක පාවිච්චිය අන්තර්ගත ක්‍රියාකාරකමකින් ජනනය වන ආදායම තුල සාමාන්‍යයෙන් වත්කමේ ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය හැර වෙනත් සාධක පිළිබිඹු වේ. උදාහරණයක් ලෙස, ආදායම කෙරෙහි වෙනත් යෙදවුම් සහ ක්‍රියාවලීන්, විකුණුම් ක්‍රියාකාරකම් සහ විකුණුම් මිල ගණන් හා පරිමාවන් වල වෙනස්වීම් බලපායි. ආදායමේ මිල සංරචකය කෙරෙහි උද්ධමනය බලපාන අතර එය වත්කමක් පාරිභෝජනය කළ ආකාරය කෙරෙහි කවර අන්දමක හෝ බලපෑමක් ඇති නොකරයි. |
| 80 ආ | *කෘෂිකර්මය: ධාරණ වගාවන්* (LKAS 16 සහ LKAS 41 හි සංශෝධන) අස්තිත්වයක් ප්‍රථම වරට ව්‍යවහාර කරනවිටදී LKAS 8 හි ඡේද28 (ඊ) දැක්වෙන ප්‍රමාණාත්මක තොරතුරු, වාර්තාකරන කාලපරිච්ඡේදයේදී හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ. කෙසේවුවද, LKAS 8 හි ඡේද අංක 28 (ඊ) හි අවශ්‍ය කෙරෙන ප්‍රමාණාත්මක තොරතුරු ඉදිරිපත් කෙරෙන සෑම පූර්ව කාලපරිච්ඡේදයක් සඳහාම අස්තිත්වයක් විසින් ඉදිරිපත් කළයුතුවේ. |
| 80 ඇ | අස්තිත්වයක් විසින් ප්‍රථම වරට *කෘෂිකර්මය:ධාරණ වගාවන්* (LKAS 16 සහ LKAS 41ට සංශෝධන) අදාල කර ගැනීමේදී ධාරණ වගා අයිතමයක් මැනීමට තෝරා ගතයුතු අතර අදාල වාර්තා කරන කාලය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාලපරිච්ඡේදය ආරම්භයේදී පැවති සාධාරණ අගය අස්තිත්වය විසින් තෝරාගත හැකි අතර අදාල දිනට වූ සාධාරණ අගය සැළකිල්ලට ගනු ලබන එය එහි සලකන ලද පිරිවැය ලෙස භාවිත කළයුතුය. කලින් පැවති ධාරණ අගය හා සාධාරණ අගය අතර යම් වෙනසක් ඇත්නම් එය ඉදිරිපත් කර ඇති ඉතාම කලින් වූ කාලපරිච්ඡේදයේ ආරම්භයේදී වූ ආරම්භක රඳවා ගනු ලැබූ ඉපැයීම් වලට හඳුනාගත යුතුවේ. |
| 81 එ | *ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය සම්බන්ධයෙන් පිළිගත හැකි ක්‍රමය පිළිබඳව පැහැදිලි කිරීම* (LKAS 16ට සහ LKAS 38ට සංශෝධන), 2016 පෙබරවාරි මස නිකුත් කරන ලද සංශෝධිත ඡේද 56 සහ එකතු කරන ලද ඡේද 62අ යන සංශෝධනයන් 2016 ජනවාරි මස 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්වයක් ඉදිරි කාලීනව ගතයුතුය. කලින් ව්‍යවහාරයට අවසර ඇත. අස්තිත්වයක් විසින් එම සංශෝධන පෙර කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරගනු ලබන්නේ නම් එම කාරණය හෙළිදරව් කළයුතුය. |
| 81 ඔ | *කෘෂිකර්මය:* ධාරණ වගාවන් (LKAS 16ට සහ LKAS 41ට සංශෝධන) 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධන ඡේද 3,6 සහ 37 සහ එකතු කරන ලද ඡේද22 අ සහ 80ආ-80ඇ. අස්තිත්වයක් විසින් එම සංශෝධන 2016 ජනවාරි මස 01දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. කලින් භාවිතයට අවසර ඇත. අස්තිත්වයක් LKAS 8ට අනුව ඡේද 80ඇ හි විශේෂයෙන් සඳහන් අවස්ථාවලදී හැර ඉහත සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. අස්තිත්වයක් එම සංශෝධන පෙර කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරගනු ලබන්නේ නම් එම කාරණය හෙළිදරව් කළයුතුය. |

**LKAS 17 - කල් බදු**

| | |
|---|---|
| 2 | (ඇ) LKAS 41 කෘෂිකර්මය විෂය පථයට ඇතුලත්, කල්බදු ක්‍රමයට බදු ගැනුම්කරුට අයත්වන මූල්‍ය කල්බදු යටතේවූ ජීව විද්‍යාත්මක වත්කම්;හෝ |

| | |
|---|---|
| | (ඈ) LKAS 41 හි විෂය පථයට ඇතුලත් වන බදු දීමනාකරු විසින් මෙහෙයුම් බදු ක්‍රමයට සපයා ඇති ජීව විද්‍යාත්මක වත්කම් |

**LKAS 18 - අයභාරය**

වෙනස්කම් නොමැත.

**LKAS 19 - සේවක ප්‍රතිලාභ**

| | |
|---|---|
| 83 | පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් වට්ටම්කරණය සඳහා භාවිතා කරනු ලබන අනුපාතිකය (අරමුදල් සම්පාදිතවූ හෝ නොවූ වාර්තාගත කරන කාලපරිච්ඡේදයට වන) ඉහළ ගුණාත්මක සංස්ථාපිත බැඳුම්කරවල වෙළඳපොල ඵලදාව යොමුව ලෙසට ගෙන තීරණය කළහැකිය. විනිමය සඳහා මෙවැනි ඉහළ ගුණාත්මක සංස්ථාපිත බැඳුම්කර සඳහා තියුණු වෙළඳපොලක් නොමැති හෙයින් රාජ්‍ය බැඳුම්කර වල වෙළඳපොල ප්‍රතිලාභ (වාර්තාගත කරන කාලය අවසානයට) භාවිත කරනු ලබන විනිමය මත පාලනය වේ. විනිමය සහ සංස්ථාගත බැඳුම්කර වල කාලපරිච්ඡේදය හෝ රාජ්‍ය බැඳුම්කරවලදී විනිමය සහ පශ්චාත් වෘත්තීය ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ ඇස්තමේන්තුගත කාලපරිච්ඡේදය සංගත වේ. |
| 176 | IASBහි 2014 සැප්තැම්බර් මස නිකුත් කළ, 2012 - 2014 වාර්ෂික වැඩි දියුණු චක්‍රය සම්මතකර ගැනීම සංශෝධිත ඡේදය සහ එකතු කරන ලද ඡේද 177. අස්තිත්වයකට එම සංශෝධන 2016 ජනවාරි මස 01 වන දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාරයට අවසර ඇත. අස්තිත්වය විසින් එම සංශෝධන පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා භාවිතා කරන්නේ නම් එම කාරණය හෙළිදරව් කළයුතුය. |
| 177 | අස්තිත්වයක් විසින් ඡේද 176 හි සංශෝධන ප්‍රථම වරට අදාල කර ගැනීමේදී ඊට ආසන්නවම ඉදිරිපත් කර ඇති සංන්දනාත්මක කාලපරිච්ඡේදය සඳහා ද අදාල කරගත යුතුය. අදාල කරගනු ලබන යම් සංශෝධනයක් අදාල කරගැනීම නිසා යම් අළුතින් ගැලපීමක් ඇතුලත් කළයුතු විට එය පෙර කාලයට අදාල රඳවා ගනු ලැබූ ඉපැයීම්වල හඳුනාගතයුතුය. |

**LKAS 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය හා රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම**

වෙනස්කම් නොමැත.

**LKAS 21 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්වීම්වල බලපෑම්**

වෙනස්කම් නොමැත.

**LKAS 23 - ණය ගැනුම් පිරිවැය**

| | |
|---|---|
| 4(අ) | සාධාරණ අගය මත මණින ලද සුදුසුකම්ලබන වත්කමක් : උදාහරණ වශයෙන් ජීව විද්‍යාත්මක වත්කමක් LKAS 41 *කෘෂිකර්මය* විෂය පථය අනුවඃ හෝ |
| 7 (ඊ) | **ධාරණ වගාවන්.** |

**LKAS 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්**

වෙනස්කම් නොමැත.

**LKAS 26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය**

වෙනස්කම් නොමැත.

**LKAS 27- වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන**

| | |
|---|---|
| 4 | **පහත දැක්වෙන පද මෙම ප්‍රමිතියේ නිශ්චිතව දක්වා ඇති තේරුම් සහිතව භාවිතා කෙරේ:**<br><br>***ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන*** **යනු පරිපාලක සහ එහි පරිපාලිත සමාගම් වල වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම්, වියදම් සහ මුදල් ප්‍රවාහ එක් තනි ආර්ථික අස්තිත්වයක් ලෙසට ගෙන ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වේ.**<br><br>***වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන*** **යනු අස්තිත්වයක් මෙම ප්‍රමිතියේ දක්වා ඇති නියමයන්ට යටත්ව පරිපාලිත , බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිතයන්හි ආයෝජන, SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර ප්‍රමිතිය අනුව පිරිවැයට හෝ LKAS 28 ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන ප්‍රමිතයෙහි විස්තර කර ඇති පරිදි ස්කන්ධ ක්‍රමය භාවිත කර ගිණුම්ගත කිරීමට තෝරා ගතහැකි අස්තිත්වයක් විසින් මත ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වේ.** |
| 5 | පහත දැක්වෙන පද SLFRS 10 හි පරිශිෂ්ඨ අ හි *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන*, SLFRS 11*බද්ධ සැකසුම්හි* පරිශිෂ්ඨ අ සහ LKAS 28 හි ඡේද03 හි නිර්වචනය කෙරේ:<br>• ආශ්‍රිත<br>• ආයෝජිතයාගේ පාලනය<br>• ස්කන්ධ<br>• සමූහය<br>• ආයෝජන අස්තිත්වය<br>• බද්ධ පාලනය<br>• බද්ධ ව්‍යාපාර<br>• බද්ධ ව්‍යාපාරකරු<br>• පරිපාලක සමාගම<br>• සැළකියයුතු බලපෑම<br>• පරිපාලිතය |
| 6 | වෙන් වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශන යනු ඉදිරිපත් කරනු ලබන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට අමතරව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන හෝ කිසියම් ආයෝජකයෙකු සතුව පරිපාලකයන්හි ආයෝජනයන් නොමැති එහෙත් ආශ්‍රිතයන්හි හා බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජනයන් ඇති විටක එම ආශ්‍රිතයන් හෝ බද්ධ ව්‍යාපාර වල ආයෝජන ඡේද 88අ දක්වා ඇති අවස්ථාවන්හිදී හැරුනු විටදී ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කළයුතුයයි LKAS 28 න් අවශ්‍ය කෙරෙන තත්ත්වයෙන්හිදී හැර ආයෝජකයෙකු විසින් ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන වේ. |
| 7 | කිසියම් අස්තිත්වයක් සතුව පරිපාලිතයක්, ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාරයක බද්ධ ව්‍යාපාරයකුගේ හිමිකමක් නොමැති අවස්ථාවලදී ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වෙන් වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශන නොවේ. |
| 10 | **කිසියම් අස්තිත්වයක් වෙන් වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විටදී පරිපාලිතයන්හි, බද්ධ ව්‍යාපාරයන්හි සහ ආශ්‍රිතයන්හි ඇති ආයෝජනයන් ගිණුම්ගත කිරීමේදී:<br>එක්කෝ,**<br><br>(අ) **පිරිවැය මත;**<br><br>(ආ) **SLFRS 9 ට අනුකූලව;හෝ**<br><br>(ඇ) **LKAS 28 හි විස්තර කර ඇති පරිදි ස්කන්ධ ක්‍රමය භාවිතා කිරීමෙන් කළයුතුය.** |

| | |
|---|---|
| | **අස්තිත්වය සෑම ආයෝජන වර්ගයක් සඳහා එකම ගිණුම්කරණ ක්‍රමය ව්‍යවහාර කළයුතුය. පිරිවැයට හෝ ස්කන්ධ ක්‍රමය යටතේ ගිණුම්ගත කර ඇති ආයෝජන ඒවා විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස හෝ අයිතිකරුවන්ට බෙදාදීම සඳහා තබාගෙන ඇති ඒවා ලෙස වර්ගීකරණය කර ඇතිවිට (හෝ විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස හෝ අයිතිකරුවන්ට බෙදා දීම සඳහා තබාගෙන ඇති ඒවා ලෙස වර්ග කර අපහරණ කාණ්ඩයක ඇතුලත් කර ඇති) SLFRS 5 විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම් යන ප්‍රමිතයට අනුකූලව ගිණුම්ගත කළයුතුය. එබඳු අවස්ථාවල SLFRS 9 අනුව ගිණුම්ගත කර ඇති ආයෝජන මැනීම වෙනස් නොකෙරේ.** |
| **11 ආ** | පරිපාලකයක් විසින් ආයෝජන අස්තිත්වයෙන් මිදී ඇතිවිටදී හෝ ආයෝජන අස්තිත්වයක් බවට පත්වනවිටදී, තත්ත්වය වෙනස්වීම හටගත් දිනයේ සිට පහත පරිදි වෙනස්වීම් ගිණුම්ගත කළයුතුය.<br><br>(අ) අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් නොවන බවට පත්වූ විට, 10 ඡේදය ප්‍රකාර අස්තිත්වය විසින් එය පරිපාලිතයක ඇති ආයෝජන ලෙස ගිණුම්ගත කළයුතුය. අත්පත් කරගත් දිනය, තත්ත්වය වෙනස් වූ දිනය ලෙසට සැළකේ. ආයෝජන අත්පත් කරගත් සේ සළකන එම දිනට වූ පරිපාලිතයෙහි සාධාරණ අගය, හුවමාරු වූ සලකන ලද ප්‍රතිශ්‍රයාව ලෙස සළකා ඡේද10 ට අනුව ගිණුම්කරණය කළයුතුය.<br><br>I. [ඉවත් කරන ලදී.]<br><br>II. [ඉවත් කරන ලදී.]<br><br>(ආ) කිසියම් අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් බවට පත්වූ විට, එම ආයෝජනය SLFRS 9 ට අනුව එය පරිපාලිතයෙහි ඇති ආයෝජනයක් ලෙස ලාභ හෝ අලාභ තුලින් ගිණුම්ගත කළයුතුය. පරිපාලිතයෙහි මෙයට ප්‍රථම පහතට ගෙනා ධාරණ අගය සහ ආයෝජකයා තත්ත්වය වෙනස් වූ දිනට වූ සාධාරණ අගය අතර ඇති වෙනස ලාභයෙහි හෝ අලාභයෙහි ලාභයක් හෝ අලාභයක් ලෙසට සැළකිය යුතුය.<br><br>එම පරිපාලිතයන් සඳහා මීට පෙර වෙනත් අවස්ථාවක හඳුනාගන්නා ලද සමුච්චය වී ඇති යම් ලාභ හෝ අලාභ ආයෝජන අස්තිත්ව ලෙසින් සැලකෙන මෙවැනි පරිපාලිතයන්හි සම්පූර්ණ ආදායම එම ආයෝජන අස්තිත්ව විකිණීමෙන් පරිපාලිතවල තත්ත්වය වෙනස් වූ දින එම පරිපාලිතයන් ආයෝජන අස්තිත්වය විසින් විකුණන ලද සේ සැළකිය යුතුය. |
| 12 | **අස්තිත්වයකට එම අස්තිත්වය සතු පරිපාලිතයකින්, බද්ධ ව්‍යාපාරයකින් හෝ ආශ්‍රිතයකින් ලැබෙන ලාභාංශ ලැබීම එලෙස ස්ථාපිත වූ විට එම ලාභාංශ වෙන් වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනේ. අස්තිත්වය විසින් ඒකක ක්‍රමය තෝරා නොගන්නේ නම්, ආයෝජනයෙහි ධාරණ අගයේ අඩු කිරීමක් ලෙස ස්කන්ධ ලාභාංශ හඳුනා ගැනේ.** |
| 18 ඒ | *වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන්හි ස්කන්ධ ක්‍රමය* (LKAS 27ට වූ සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද, සංශෝධිත ඡේද 47,10,11 ආ සහ 12. අස්තිත්වයක් එම සංශෝධනයන් 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා අතීතානුයෝගීව LAKS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ වැරදි* ප්‍රමිතියට අනුකූලව ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාරයට ද අවසර ලැබේ. අස්තිත්වයක් විසින් එම සංශෝධන ඊට පෙර කාලය සඳහා අදාළ කරගනු ලබන්නේනම් එය එම කාරණය හෙළිදරව් කළයුතුය. |

**LKAS 28 -ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජනයන්**

| | |
|---|---|
| **17(ඇ)** | පරිපාලකයක් විසින් පොදු භාවිතය උදෙසා ඉදිරිපත් කරනු ලබන අවසාන හෝ ඕනෑම අතරමැදි මූල්‍ය ප්‍රකාශනයන් SLFRS සමඟ අනුකූල වන පරිදි, පරිපාලිත ඒකාබද්ධවීමේදී හෝ සාධාරණ අගය අනුව කළයුතු වන්නේනම් ලාභ හෝ අලාභ තුලින් මිනුම්කරණය කිරීමේදී SLFRS 10 හි නියමයන්ට අනුව සිදුකල යුතුය. |

| | |
|---|---|
| 25 | කිසියම් අස්තිත්වයකට අයත්ව තිබූ ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකම හීනවී ඇත්නම්, නමුත් ආයෝජනය ආශ්‍රිතයක් ලෙසට හෝ බද්ධ ව්‍යාපාරයක් ලෙසට පිළිවෙලින් අඛණ්ඩව වර්ගීකරණය, අදාල වත්කම හෝ වගකීම විකුණා දමන අවස්ථාවේදී එසේ අයිතියෙහි අඩුවූ ප්‍රමාණය, අස්තිත්වය මීට ඉහත හඳුනාගත් වෙනත් විස්තීරණ ආදායම් වලට නැවත වර්ගීකරණය කළයුතුය. |
| 27 | ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරය, සමූහය සතු කොටස වන්නේ පරිපාලක සහ එහි පරිපාලිතයන් එම ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාරයන්හි අයත්ව ඇති සමස්ත අයිතියවේ. සමූහයේ රඳවාගෙන ඇති අනෙකුත් ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර මෙම පරමාර්ථය උදෙසා නොසළකා හරිනු ලැබේ. කිසියම් ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් සතු පරිපාලිත, ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර, ලාභ හෝ අලාභ, වෙනත් විස්තීරණ ආදායම සහ ශුද්ධ වත්කම් ආදිය සැලකිල්ලට ගෙන ස්කන්ධ ක්‍රමය අදාල කරගෙන ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල (ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස,වෙනත් විස්තීරණ ආදායම සහ එහි ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර වල ශුද්ධ වත්කම්) ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා අවශ්‍ය යම් සංශෝධනයන් කිරීමෙන් පසු ඉදිරිපත් කළයුතුවේ. (ඡේද35 - 36අ බලන්න.) |
| 36 | 36අ ඡේදයේ විස්තර කර ඇති පරිදි හැර, සමාන තත්ත්වයන් වලදී එක හා සමාන ගණුදෙනු හා සිද්ධීන් සඳහා අස්තිත්වය ව්‍යවහාර කරන ඒවා හැර වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් ව්‍යවහාර කරන විට, අස්තිත්වය ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කරන විට ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවන සේ අස්තිත්වය විසින් ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන භාවිතා කිරීමේදී ආශ්‍රිතයේ හෝ බද්ධව්‍යාපාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට ගැලපීම් කළයුතුය. |
| 36අ | 36 ඡේදයෙහි දැක්වෙන අවශ්‍යතා කෙසේවුවද, ආයෝජන අස්තිත්වයක් නොවන අස්තිත්වයකට ආයෝජන අස්තිත්වයක් වන ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකමක් ඇතිවිට අස්තිත්වය විසින් ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කරනවිට එම ආයෝජන අස්තිත්ව ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර විසින් එම ආයෝජන අස්තිත්ව ආශ්‍රිතයන්ට හෝ බද්ධ ව්‍යාපාර වලට පරිපාලිතයන්හි ඇති හිමිකම් සඳහා ව්‍යවහාර කළ සාධාරණ අගය මිනුම තවදුරටත් එලෙසම පවත්වා ගනී. |
| 45ආ | *වෙන් වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශනයන්හි ස්කන්ධ ක්‍රමය* (LKAS 27ට සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධිත ඡේද25. අස්තිත්වයක් 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන්ට එම සංශෝධිතය ව්‍යවහාර කළයුතු අතර LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* අනුව අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. |
| 45ඇ | *ආයෝජන අස්තිත්වයන් : ඒකාබද්ධ ව්‍යතිරේක ව්‍යවහාර කිරීම* (SLFRS 10, SLFRS 12 සහ LKAS 28ට සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධිත ඡේද 17, 27 සහ 36 සහ එකතු කරන ලද ඡේද 36අ. අස්තිත්වයක් විසින් එම සංශෝධන 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේදය සඳහා ව්‍යවහාර කළ හැකිය. කලින් ව්‍යවහාරය සඳහා අවසර දෙනු ලැබේ. අස්තිත්වයක් මෙම සංශෝධන පෙර කාලපරිච්ඡේදයක් සඳහා අනුගමනය කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |

## LKAS 29 – අධි උද්ධමනකාරී ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය

වෙනස්කම් නොමැත.

## LKAS 32 - මූල්‍ය සාධන පත්‍ර : ඉදිරිපත් කිරීම

වෙනස්කම් නොමැත.

## LKAS 33 - කොටසක ඉපැයුම්

වෙනස්කම් නොමැත.

## LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය

| | |
|---|---|
| 5 ඊ | …. සටහන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීම් වලින් සමන්විත සටහන්; |
| 16 අ | **ඡේද 15 - 15ඇ ඡේදයන් අනුව හෙළිදරව් කළයුතු වැදගත් සිද්ධීන් සහ ගණුදෙනු වලට අමතරව අස්තිත්වයක් පහත දැක්වෙන තොරතුරු එහි අතුරු මූල්‍ය වාර්තාවල සටහන් තුල හෝ අතුරු මූල්‍ය වාර්තාවල වෙනත් තැනක ඇතුලත් කළයුතුය. පහත දැක්වෙන හෙළිදරව් කිරීම්, අතුරු මූල්‍ය ප්‍රකාශන වලින් හෝ හරස් යොමු මඟින් වෙනත් ප්‍රකාශන තුල (කළමනාකරණ විවරණය හෝ අවදානම් වාර්තාව වැනි) පරිශීලකයන් සඳහා තිබෙන මූල්‍ය ප්‍රකාශන තුල, අතුරු මූල්‍ය වාර්තා වල දැක්වෙන එම යොමු සහ එම කාලය තුල විය යුතුය. පරිශීලකයන්ට හරස් යොමු සමඟින් එම කාලය තුල, එම යොමු සමඟින් වූ මූල්‍ය ප්‍රකාශන ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා නොමැත්තේ නම් අතුරු මූල්‍ය ප්‍රකාශන අසම්පූර්ණ වේ. සාමාන්‍යයෙන් තොරතුරු වාර්තාකරණය වන්නේ මූල්‍ය වර්ෂයේ සිට එදිනට දක්වා වූ පදනම මතය.** |
| 56 | IASBහි, 2014 සැප්තැම්බර් මස නිකුත් කරන ලද, *2012-2014 වාර්ෂික වැඩි දියුණු කිරීම් චක්‍ර* අදාල කර ගැනීම සංශෝධිත ඡේද 16අ. අස්තිත්වයක් එම සංශෝධනය 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි* යන ප්‍රමිතය ප්‍රකාරව අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාරය සඳහා අවසර ලැබේ. යම් අස්තිත්වයක් පෙර කාලපරිච්ඡේදයක් සඳහා සංශෝධනය ව්‍යවහාර කරගන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| 57 | *හෙළිදරව් කිරීම් ආරම්භය* (LKAS 1ට සංශෝධන) 2015 මාර්තු මස නිකුත් කරන ලද, සංශෝධිත ඡේද 5. අස්තිත්වයක් විසින් එම සංශෝධනය 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. එම සංශෝධනය කලින් ව්‍යවහාර කිරීම සඳහා අවසර ලැබේ. |

## LKAS 36 - වත්කම් හානිකරණය

| | |
|---|---|
| 2(උ) | **කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ ජීව විද්‍යාත්මක වත්කම් LKAS 41 *කෘෂිකර්මයෙහි* විෂය පථයට අයත් සාධාරණ අගයෙන් විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු අගයට මැනුම්කරණය කරනඃ** |

## LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්

වෙනස්කම් නොමැත.

## LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්

| | |
|---|---|
| **92** | අතීතයේදී අත් දුටු තාක්ෂණයෙහි වූ සීග්‍ර වෙනස්වීම් අනුව සලකන කළ පරිගණක මෘදුකාංග සහ වෙනත් බොහෝ අස්පෘශ්‍ය වත්කම් පහසුවෙන් තාක්ෂණික යල් පැනීමට භාජනය වේ. එහෙයින්, බොහෝවිට ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඉතා කෙටිය. අස්පෘශ්‍ය වත්කමක් භාවිතා කර නිෂ්පාදනය කළ අයිතමයක අනාගත අපේක්ෂිත මිල අඩුවීම එම වත්කමේ තාක්ෂණික හෝ වාණිජ යල්පැනීමේ අපේක්ෂාවක් පෙන්නුම් කළහැකි අතර එය පෙරලා වත්කමක අන්තර්ගත අනාගත ප්‍රතිලාභ අඩුවීමක් පිළිබිඹු කිරීමේ හැකියාව පවතී. |

| | |
|---|---|
| 98අ | අස්පෘශ්‍ය වත්කමක භාවිතය ඇතුලත් වන ක්‍රියාකාරකමකින් උත්පාදනය වන ආදායම පදනම් කරගත් ක්‍රමක්ෂය ක්‍රමයක් නුසුදුසු බවට බිඳ හෙලිය නොහැකි උපකල්පනයක් පවතී. අස්පෘශ්‍ය වත්කමක භාවිතය ඇතුලත් වන ක්‍රියාකාරකමකින් ජනනය කරන ආදායමක අස්පෘශ්‍ය වත්කමක භාවිතය අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනයට සෘජුව සම්බන්ධ නොවන සාධකයන් දර්ශීයව පිළිබිඹු වේ. උදාහරණ ලෙස ආදායම කෙරෙහි වෙනත් යෙදවුම් හා ක්‍රියාවලීන්, විකුණුම් ක්‍රියාකාරකම් සහ විකුණුම් පරිමාවන්හි හා මිල ගණන්වල ඇතිවන වෙනස්වීම් බලපායි. ආදායමේ ඇතුලත් මිල සංරචකය කෙරෙහි උද්ධමනය බලපාන අතර එය වත්කම පරිභෝජනය කළ ආකාරය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි. මෙම උපකල්පනය මඟහැරවිය හැක්කේ සීමිත තත්ත්වයන් යටතේ පමණි. එනම් ;<br>(අ) 98ඇ ඡේදයේ විස්තර කර ඇති පරිදි, අස්පෘශ්‍ය වත්කම ආදායමෙහි මිනුමක් ලෙස ප්‍රකාශ කර ඇති අවස්ථාවක: හෝ<br>(ආ) ආදායම හා අස්පෘශ්‍ය වත්කමේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය අතර ඉතා ඉහළ සහසම්බන්ධතාවයක් (correlation) ඇතිබැව් පැහැදිලිව ඔප්පු කිරීමට හැකියාව තිබෙනවිට. |
| 98ආ | 98 ඡේදයට අනුකූලව යෝග්‍ය ක්‍රමක්ෂය ක්‍රමයක් තෝරා ගැනීමේදී අස්තිත්වයකට අස්පෘශ්‍ය වත්කමට ආවේණික ප්‍රධාන සීමාකාරී සාධකය නිශ්චය කළ හැක. උදාහරණයක් ලෙස, අස්පෘශ්‍ය වත්කමක් භාවිතය පිළිබඳ අස්තිත්වයට ඇති අයිතිවාසිකම් දැක්වෙන ගිවිසුමෙහි අස්පෘශ්‍ය වත්කම භාවිත කිරීම පිළිබඳවූ කලින් නිශ්චය කළ වර්ෂ ගණනින් (එනම්ඃ කාලය), හෝ නිෂ්පාදනය කළ ඒකක ගණන වශයෙන් හෝ උපයනු ලබන ආදායමේ යම් නිශ්චය කළ ස්ථාවර මුළු මුදලක් ලෙස හෝ නිශ්චිතව දැක්වීමට ඉඩ ඇත. එවැනි සීමාකාරී සාධකයක් හඳුනාගැනීම ක්‍රම ක්ෂය සඳහා යෝග්‍ය පදනමක් හඳුනාගැනීමේ ආරම්භක ලක්ෂ්‍යක් ලෙස යොදාගත හැකි නමුත් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජන රටාව වඩාත් හොඳින් පිළිබිඹු කරන්නේ නම් වෙනත් පදනමක් ව්‍යවහාර කළහැකිය. |
| 98ඇ | ප්‍රධාන සීමාකාරී සාධකය, අස්පෘශ්‍ය වත්කමකට ආවේණික වූ ආදායම් උපදවන්නා වූ ප්‍රවේශ ලක්ෂ්‍යය වන අවස්ථා වලදී, උපදවන ආදායම, ක්‍රමක්ෂය කිරීමේ පදනම ලෙස යොදාගත හැකිය. උදාහරණ ලෙස, කිසියම් අස්තිත්වයකට ගවේෂණය කර රන් ආකරයකින් රන් නිස්සාරණය කර ගැනීම සඳහා අවසරයක් ලබාගත හැකිය. ගිවිසුමෙහි කල් ඉකුත්වීම, නිස්සාරණය කර උපදවා ගන්නා ලද මුළු ආදායමේ ස්ථිර එකතුවක පදනම මත සිදුවිය හැකි අතර (උදාහරණ ලෙස, ගිවිසුමක් මගින් ආකරයකින් මුළු නිස්සාරණයකරන රන් වලින් සමුච්චිත රන් අලෙවිය රුඃ බිලියන 2ට ළඟා වනතුරු සිදුකිරීමට අනුමැතිය දිය හැකිය) එය කාල පදනම මත හෝ නිස්සාරණය කරන ලද රන් ප්‍රමාණය මත පදනම් නොවේ. තවත් උදාහරණයක් ලෙස, ගාස්තු අය කරන මාර්ගයක ක්‍රියාත්මක කිරීම, සමස්ථ ගාස්තු අය කිරීමෙන් උපයනු ලබන ආදායමින් ස්ථිර මුළු මුදලක පදනම මත විය හැකිය. (උදාහරණ ලෙස, ගිවිසුමකින් ගාස්තු අය කරන මාර්ගයක ක්‍රියාත්මක කිරීම, සමුච්චිත ගාස්තු රුඃ මිලියන 100 දක්වා ළඟාවන තෙක් ක්‍රියාත්මක කළ හැකිවීම). ගිවිසුමෙහි ඇතුලත්ව ඇති අස්පෘශ්‍ය වත්කම භාවිතය සඳහා බලපවත්නා වූ සීමාකාරී සාධකය ආදායම ස්ථාපනය කර ඇති විට, උපදවා ගනු ලබන ආදායම අස්පෘශ්‍ය වත්කම සුදුසු පදනමක් මත ක්‍රම ක්ෂය කිරීම, ගිවිසුමෙහි විශේෂයෙන් දක්වා ඇති උපදවා ගතහැකි ස්ථාවර මුළු ආදායම් එකතුව මත ක්‍රමක්ෂය තීරණය කිරීමට ඉඩ දෙනු ලැබේ. |
| **130ඒ** | *ක්ෂයවීම සහ ක්‍රමක්ෂය සඳහා පිළිගත හැකි ක්‍රම පැහැදිලි කිරීම* 2016 පෙබරවාරි මස නිකුත් කළ (LKAS 16 සහ LKAS 38 සංශෝධන), සංශෝධිත ඡේද 92 සහ 98 සහ එකතු කරන ලද ඡේද 98අ - 98ඇ. යම් අස්තිත්වයක් 2016 ජනවාරි 01 දින හෝ ඊටපසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදවලට එම සංශෝධන ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාරයන් සඳහා අවසර දෙනු ලැබේ. අස්තිත්වයක් විසින් මෙම සංශෝධන පෙර කාලපරිච්ඡේදයන් සඳහා ව්‍යවහාර කරනු ලබන්නේ නම් එම කාරණය හෙළිදරව් කළයුතුය. |

## LKAS 39 -මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම

| | |
|---|---|
| 88 | **[ඉවත් කරන ලදී.]** |

## LKAS 40 -ආයෝජන දේපල

| | |
|---|---|
| **4(අ)** | කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධිත ජීව විද්‍යාත්මක වත්කම් (*LKAS 41 කෘෂිකර්මය* සහ *LKAS 16 දේපල පිරියත හා උපකරණ*): සහ |
| **7** | බදු කුලිය ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන වර්ධනය සඳහා හෝ මෙම කාරණා දෙකම සඳහා ආයෝජන දේපල තබා ගැනේ. එමනිසා යම් අස්තිත්වයක් සතු අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව ආයෝජන දේපල මගින් විශාල මුදල් ප්‍රවාහයක් උත්පාදනය කරනු ලැබේ. මෙම කරුණ මගින් ආයෝජන දේපල, අයිතිකරු පදිංචිගත දේපල වලින් වෙන්කොට දක්වයි. නිෂ්පාදනය හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම, (හෝ පරිපාලන කටයුතු සඳහා දේපල යොදා ගැනීම) මුදල් ප්‍රවාහ උත්පාදනය කරනු ලබන අතර ඒවා දේපල හේතු කොටගෙන පමණක් නොව නිෂ්පාදනය හෝ සේවා ක්‍රියාවලින් සඳහා භාවිතා කරන නිසා අනෙකුත් වත්කම්වෙයි. LKAS 16 අයිතිකරු පදිංචියට ගනු ලබන දේපල සඳහා ව්‍යවහාර කෙරේ. |

## LKAS 41 -කෘෂිකර්මය

<table>
<tr><td>1 (අ )</td><td>ජීව විද්‍යාත්මක වත්කම් - ධාරණ වගාවන් හැරඃ</td></tr>
<tr><td>2 (ආ)</td><td>කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධිත ධාරණ වගාවන් (LKAS 16 බලන්න) ඃ කෙසේනමුත්, මෙම ප්‍රමිතිය එම ධාරණ වගාවන්හි නිෂ්පාදන වලට ව්‍යවහාර වේ.</td></tr>
<tr><td>2(ඇ)</td><td>ධාරණ වගාවන් හා සම්බන්ධිත රාජ්‍ය ප්‍රදානයන් (LKAS 20 රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය හා රාජ්‍ය අනුග්‍රහය හෙලිදරව් කිරීම බලන්න).</td></tr>
<tr><td>3</td><td>මෙම ප්‍රමිතිය කෘෂිකාර්මික නිෂ්පාදනවලට එනම් අස්තිත්වයෙහි ජීව විද්‍යාත්මක වත්කම් වලින් අස්වැන්න නෙලන අවස්ථාවේදී නෙලා ගනු ලැබූ අස්වැන්න, අදාල කරගනු ලැබේ. අනතුරුව LKAS 2 තොග හෝ අදාල කරගත හැකි වෙනත් ප්‍රමිතියක් අදාල කරගනු ලැබේ. මෙම ප්‍රමිතිය අස්වැන්න නෙලීමෙන් පසුව කාෂිකාර්මික නිෂ්පාදන සැකසීම වන ක්‍රියාවලීන් සඳහා අදාල නොවේ.<br><br>උදාහරණ වශයෙන්, මිදි වවන්නෙකුගේ මිදි ඵලදාව වයින් බවට පත්කිරීම දක්වා වූ ක්‍රියාවලිය ගත හැකිය. මෙවැනි ක්‍රියාවලීන් කෘෂිකාර්මික ක්‍රියාවලියන්හි තාර්කික හෝ ස්වභාවික දිගුවක් විය හැකි අතර,සිදුවනු ලබන එම සිදුවීම් හා ජීව විද්‍යාත්මක වෙනස්වීම් අතර යම්කිසි සමානතාවයක් තිබුණද, මෙවැනි සැකසීමක් මෙම ප්‍රමිතියෙහි කෘෂිකාර්මික ක්‍රියාකාරකමක් යන නිර්වචනයට ඇතුලත් නොවේ.</td></tr>
<tr><td>4</td><td>පහත දැක්වෙන වගුවෙහි ජීව විද්‍යාත්මක වත්කම්, කෘෂිකාර්මික ඵලදාව සහ කාෂිකාර්මික නිෂ්පාදන පිළිබඳ උදාහරණ සහ අස්වැන්න නෙලීමෙන් අනතුරුව වන ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙසට වූ නිෂ්පාදන දැක්වේඃ
<table>
<tr><th>ජීව විද්‍යාත්මක වත්කම්</th><th>කෘෂිකාර්මික ඵලදාව</th><th>අස්වැන්නෙන් පසු සැකසීමේ ප්‍රතිඵල වන නිෂ්පාදන</th></tr>
<tr><td>බැටළුවා</td><td>ලොම්</td><td>නූල්,පාපිසි</td></tr>
<tr><td>වගාවක ඇති ගස්</td><td>කපා හෙලන ලද ගස්</td><td>ලී කොට, සකස් කරන ලද දැව</td></tr>
<tr><td>ගව පට්ටි</td><td>කිරි</td><td>චීස්</td></tr>
<tr><td>ඌරන්</td><td>මරණ ලද ඌරන්</td><td>සොසේජස්, ලුණු දැමූ ඌරු ගාත</td></tr>
<tr><td>කපු පැල</td><td>නෙලන ලද කපු</td><td>නූල්, ඇඳුම් පැලඳුම්</td></tr>
<tr><td>උක්</td><td>කපන ලද උක් ගස්</td><td>සීනි</td></tr>
<tr><td>දුම්කොල පැල</td><td>නෙලන ලද පත්‍ර</td><td>සකස් කරන ලද දුම්කොල</td></tr>
<tr><td>තේ පඳුරු</td><td>නෙලන ලද දළු</td><td>තේ</td></tr>
</table></td></tr>
</table>

| | | |
|---|---|---|
| මිදි වැල් | නෙලන ලද මිදි | වයින් |
| පලතුරු ගස් | නෙලන ලද පලතුරු | සැකසූ පලතුරු |
| තෙල් ෆාම් ගස් | නෙලන ලද ගෙඩි | ෆාම් තෙල් |
| රබර් ගස් | නෙලන ලද රබර් කිරි | රබර් නිෂ්පාදිත |

සමහර පැලෑටි වර්ග, උදාහරණ ලෙස, තේ පඳුරු,මිදි වැල් , තෙල් ෆාම් පැල සහ රබර්ගස් සාමාන්‍යයෙන් ධාරණ වගාවන් යන නිර්වචනය සපුරනු ලබන අතර සඳහා LKAS 16 හි විෂය පථයට ඇතුලත් වේ.

කෙසේ නමුත්, ධාරණ වගාවන්හි හටගන්නා ඵලදාව, උදාහරණ වශයෙන්; තේ කොල,මිදි, තෙල් ෆාම්, පළතුරු, LKAS 41 හි විෂය පථයට ඇතුලත්ය.

5 **පහත දැක්වෙන පද නිශ්චිතව දක්වා ඇති තේරුම් සහිතව මෙම ප්‍රමිතියෙහි යෙදේ:**

**කෘෂිකාර්මික ක්‍රියාකාරකමක් යනු අස්තිත්වයක් විසින් ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හෝ අතිරේක ජීව විද්‍යාත්මක වත්කම් වලට පරිවර්තනය කිරීම සහ ජීව විද්‍යාත්මක වෙනස්කම් කිරීම සහ නෙලාගැනීම කළමනාකරණය කිරීමය.**

**කෘෂිකාර්මික නිෂ්පාදනයක් යනු අස්තිත්වයේ ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලාගත් ඵලදාවයි.**

**ධාරණ වගාවක් යනු :**

**(අ ) කෘෂිකාර්මික නිෂ්පාදන නිෂ්පාදනය කිරීමට හෝ සැපයීමට යොදා ගන්නාඃ**

**(ආ) එක් කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් සඳහා නිෂ්පාදනය නෙලාගනු ලැබේ යයි අපේක්ෂා කරන සහඃ**

**(ඇ) අනියම් සුන්බුන් ලෙස විකිණීම හැර කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලෙස විකිණීමට දුර්ලභ හැකියාවක් ඇති වගාවකි.**

**ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවත්වන සත්වයෙකු හෝ පැලෑටියකි.**

**ජීව විද්‍යාත්මක පරිණාමය යනු, වැඩීම, පිරිහීම, නිෂ්පාදනය සහ ප්‍රජනනය යන ක්‍රියාවලින්ගෙන් සමන්විත ජීව විද්‍යාත්මක වත්කමක සිදුවන ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක වෙනස්කම්වේ.**

**විකිණීම සඳහා වියදම් යනු වත්කමක් ඉවත් කිරීම හා සම්බන්ධයෙන් මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම හැර ඍජුව අදාලවන වර්ධක පිරිවැයයි .**

**ජීව විද්‍යාත්මක වත්කම් සමූහය යනු සමාන ස්වරූපයේ ජීවත්වන සතුන් හෝ පැලෑටි සමාහාරයකි.**

**අස්වැන්න යනු ජීව විද්‍යාත්මක වත්කමකින් නිෂ්පාදනය නෙලා ගැනීම හෝ ජීව විද්‍යාත්මක වත්කමක ආයු කාල ක්‍රියාවලිය නතරවීමය.**

**5 අ** ධාරණ වගාවන්ට පහත සඳහන් දේ අයත් නොවේඃ

(අ) කෘෂිකාර්මික නිෂ්පාදන ලෙස අස්වනු ලබාගැනීම සඳහා වගා කරනු ලැබූ පැල (උදාහරණ ලෙස,දැවදඬු ලෙස භාවිතාකිරීම සඳහා වගා කළ ගස්) :

(ආ) කෘෂිකාර්මික ඵලදාවක් උදෙසා වගා කරනු ලබන පැල,අස්තිත්වයකට අස්වැන්න නෙලීමට මෙන්ම කෘෂිකාර්මික ඵලදාවක් ලෙසට විකිණීමට විරල නොවන ඉඩකඩක් ඇතිවිට මෙන්ම වෙනත් ලෙසකින් නොවැදගත් සුන්බුන් අලෙවියටඉඩ ඇතිවිට (උදාහරණ ලෙස පළතුරු සඳහා මෙන්ම අනවශ්‍ය දැවදඬු සඳහා වගා කළහැකි ගස් වගා කිරීම) : සහ

(ඇ) වාර්ෂික අස්වැන්න (උදාහරණ ලෙස ඉරිඟු සහ තිරිඟු).

| | |
|---|---|
| 5 ආ | ධාරණ වගාවන් තවදුරටත් දාරක නිෂ්පාදන ලෙසට යොදා නොගන්නා විට, ඒවා කපා දමා සුන්බුන් ද්‍රව්‍ය ලෙස අලෙවි කළහැකිය. උදාහරණ ලෙස, දර ලෙසට භාවිතාකිරීම සඳහා. මෙබඳු සුන්බුන් අලෙවි කිරීම දාරක වැවිලි සම්බන්ධ නිර්වචනය සපුරා ලීමට බාධාවක් නොවේ. |
| 5 ඇ | දාරණ වගාවන්හි වැඩෙන එලදාවන් ජීව විද්‍යාත්මක වත්කමක් වේ. |
| 8 | **[ඉවත් කරන ලදී ].** |
| 24 (අ) | ස්වල්ප ජීව විද්‍යාත්මක පරිණාමයකින් යුක්ත දේ සම්බන්ධව දරන ලද මූලික වියදම (උදාහරණ ලෙස, වාර්තාගත කරන කාලය ආසන්නයට පෙර පැලබීජ සඳහා පැල කිරීමක් හෝ ගොවිපලක අළුතින් අත්පත් කරගන්නා ලද සතුන්); |
| 44 | පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යනු, කෘෂිකාර්මික නිෂ්පාදන අස්වනු නෙලා ගත හැකි හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස විකිණියහැකි දේ වේ. පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා උදාහරණ ලෙස, ගොවිපලකමස් නිෂ්පාදනය කිරීම පිණිස සිටින සතුන්, විකිණීම පිණිස ගොවිපලක සිටින සතුන්, ගොවිපලක සිටින මත්ස්‍යයින්, ඉරිඟු සහ තිරිඟු වැනි ධාන්‍ය වර්ග, ධාරණ වගාවන්හි නිෂ්පාදිතයන් සහ දැව සඳහා වවනු ලබන අනවශ්‍ය ගස්. ධාරණ ජීව විද්‍යාත්මක වත්කම් යනු, මෙම පරිභෝජනය කළහැකි ජීව විද්‍යාත්මක වත්කම් හැර උදාහරණ වශයෙන්, ගොවිපලක සතුන්ගෙන් නිපදවනු ලබන කිරි සහ පලතුරු, නෙලාගනු ලැබූ එම පලතුරු ගස් දැක්විය හැක. ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යනු පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් නොවන ඒවාය. වගාවන්, සහ ලී දඬු සඳහා වවනු ලබන ගස් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් පිළිබඳ උදාහරණයන්ය. පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක හැර අනෙක් ඒවා එල දරණ ජීව විද්‍යාත්මක වත්කම්වේ. උදාහරණ ලෙස, කිරි නිෂ්පාදනය කරන පශු සම්පත්, පලතුරු අස්වනු ලබාගන්නා පලතුරු ගස් දැක්විය හැක. ධාරණ ජීව විද්‍යාත්මක වත්කම්යනු පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් නොවන ඒවාය. |
| 62 | කෘෂිකර්මය:ධාරණ වගාවන් (LKAS 16 සහ LKAS 41 ට සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද, සංශෝධිත ඡේද 1-5, 8, 24 සහ 44 සහ එකතු කරන ලද ඡේද 5අ - 5ඇ සහ 63.යම් අස්තිත්වයකට එම සංශෝධන 2016 ජනවාරි මස 01 වන දින හෝ ඊටපසු ආරම්භ වන කාලපරිච්ඡේදයන් සඳහා අදාල කරගත යුතුය. ඊට කලින් ව්‍යවහාරය සඳහා යොදා ගැනීමට ද අවසර ඇත. යම් අස්තිත්වයක් විසින් එම සංශෝධන පූර්ව කාලපරිච්ඡේදයන් සඳහා ව්‍යවහාර කරනු ලබන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. අස්තිත්වයක් විසින් LKAS 8ට අනුකූලව මෙම සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. |
| 63 | කෘෂිකර්මය:ධාරණ වගාවන් (LKAS 16 සහ LKAS 41 ට වූ සංශෝධන ) යම් අස්තිත්වයක් විසින් පළමු වරට ව්‍යවහාර කරන වාර්තාකරණ කාලපරිච්ඡේදයේදී LKAS 8 හි 28 (ඊ) ඡේදයෙන් අවශ්‍ය කෙරෙන ප්‍රමාණාත්මක තොරතුරු ප්‍රවර්තන වර්ෂය සඳහා හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වුවද, අස්තිත්වයක් විසින් ඉදිරිපත් කරන සෑම පූර්ව කාලපරිච්ඡේදයක් සඳහාම LKAS 8 හි 28 (ඊ)ඡේදයෙන් අවශ්‍ය කෙරෙන ප්‍රමාණාත්මක තොරතුරු ඉදිරිපත් කළයුතුය. |

**SLFRS 1 -ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත ප්‍රථම වරට භාවිතා කිරීම**

| | |
|---|---|
| 39ප | SLFRS 14 නියාමන විලම්බන ගිණුම් 2014 ජූනි මස නිකුත් කරන ලදී. 2016 ජනවාරි මස 01 දින සිට හෝ ඉන්පසුව ආරම්භක වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා සංශෝධිතයන් අදාල වේ. සංශෝධිත ඡේද ඇ8ආ අස්තිත්වයක් අදාල කරගත යුතුය. කලින් ව්‍යවහාරයට අවසර ඇත. යම් අස්තිත්වයක් SLFRS 14 පූර්ව කාලපරිච්ඡේදයන් සඳහා ව්‍යවහාර කරන්නේනම්, එම සංශෝධනය එම පූර්ව කාලපරිච්ඡේදය සඳහා ව්‍යවහාර කළයුතුය. |

| | |
|---|---|
| 39ඞ | *බද්ධ මෙහෙයුම්වල හිමිකම අත්පත් කර ගැනීම් සඳහා ගිණුම්කරණය* (SLFRS 11ට සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධිත ඡේදඇ 5. අස්තිත්වයක් එම සංශෝධනය 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා අදාල කරගත යුතුය. යම් අස්තිත්වයක් පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා SLFRS 11ට සම්බන්ධිත සංශෝධන *බද්ධ මෙහෙයුම් හිමිකම් අත්පත් කර ගැනීම් ගිණුම්කරණය* සඳහා ව්‍යවහාර කරගන්නේ නම් (SLFRS 11ට සංශෝධන), ඡේද ඇ 5ට වූ සංශෝධන එම පූර්ව කාලපරිච්ඡේදයට ව්‍යවහාර කරගත යුතුය. |
| 39 ර | වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන වල ස්කන්ධ ක්‍රමය: (LKAS 27ට සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධිත ඇ14 ඡේදය සහ එකතු කරන ලද ඡේද ඇ15අ ඡේදය. අස්තිත්වයකට 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසු පටන් ගන්නා වාර්ෂික කාලපරිච්ඡේද සඳහා එම සංශෝධන ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාරය සඳහා අවසර තිබේ. අස්තිත්වයක් විසින් පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා එම සංශෝධන අදාල කරගන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| 39 අ අ | 2014 සැප්තැම්බර් මස නිකුත් කළ, IABSහි 2012 -2014 වාර්ෂික වැඩි දියුණු කිරීම් චක්‍රය සම්මත කර ගැනීම,එකතු කරන ලද පරිච්ඡේද ඉ4 අ.යම් අස්තිත්වයක් 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධන ව්‍යවහාර කළයුතුය. කලින් භාවිතය සඳහා ද අවසර තිබේ. අස්තිත්වයක් විසින් පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා එම සංශෝධනය අදාල කරගන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| ඇ 5 | SLFRS 3හි නිර්වචනය කර ඇති පරිදි, පූර්ව ව්‍යාපාර සංයෝජනයන් සඳහා වූ මුක්තිය ද,අතීතයේ ආයෝජන ලෙසින් කළ අත්පත් කරගෙන තිබූ ආශ්‍රිත, බද්ධ ව්‍යාපාර හිමිකම් සහ ව්‍යාපාරයක් ලෙස සංස්ථාපනය වී පැවැති බද්ධ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල හිමිකම් සඳහා ද අදාල කරගත හැකිය. තවද, එවැනි සියළු අත්පත් කර ගැනීම් සඳහා ඡේද ඇ1 තෝරා ගන්නා ලද දිනය ක්‍රියාත්මක වේ. |
| ඇ 8 ආ | සමහර අස්තිත්වයන් පාවිච්චියට ගනු ලබන හෝ පෙර කාලයකදී පාවිච්චි කර ඇති දේපල,පිරියත හා උපකරණ හෝ අස්පෘශ්‍ය වත්කම් වැනි අයිතම්, විධිමත්වූ අගය තක්සේරු කිරීමකට යටත්ව මෙහෙයුම් කටයුතු සඳහා තබා ගනී. මෙවැනි අයිතමයන්හි ධාරණ අගය කලින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයටතේ තීරණය කර තිබිය හැක. නමුත් SLFRSs යටතේප්‍රාග්ධනිත කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ නැත. එවැනි සිද්ධීන්හිදී, ප්‍රථම වතාවට අනුගමනය කරනු ලබන අයට, එසේ මාරුවන සංක්‍රාන්ති දිනයේ එම අයිතමයේ කලින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව පහතට ගෙන ආ වටිනාකම SLFRSs පරිදි හැඟවෙන පිරිවැය ලෙස යොදාගත හැකිය. අස්තිත්වයක් විසින් අයිතමයක් සඳහා වූ මෙම මුක්තිය අදාල කරගනු ලබන විටදී එය එහි සියළුම අයිතමයන් සඳහා අදාල කර ගැනීමට අවශ්‍ය නැත. SLFRSsට මාරුවන සංක්‍රාන්ති දින අස්තිත්වයක් මෙම මුක්තිය භාවිතා කරන සෑම අයිතමයක් වෙනුවෙන්ම LKAS 36ට අනුව හානිකරණ පරීක්ෂණය සිදුකළයුතුය. මෙම පරිච්ඡේදයෙහි පරමාර්ථය සඳහා මෙහෙයුම් කටයුතු අගය නියාමනයට යටත්වන්නේ නම් එවා පාලනය කිරීම, පාරිභෝගිකයින් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයෙන තහවුරු වූ මිළ වෙනස් කිරීමට හැකි රාමුව සහ එම රාමුව අභිබවායාම හෝ අනුපාතික අගය නියාමකයකු විසින් අනුමත කිරීමවේ. (SLFRS 14 *නියාමන විලම්බන ගිණුම්* හි නිර්වචනය කර ඇති පරිදි) |
| **ඇ 14 (ඇ)** | LKAS 28 හි දැක්වෙන විස්තරකර ඇති පරිදි ස්කන්ධ ක්‍රමය භාවිතා කිරීමෙන්. |
| **ඇ 15 අ** | ප්‍රථම වතාවට භාවිතා කරන්නෙකු මෙවැනි ආයෝජන ගිණුම් සඳහා ස්කන්ධ ක්‍රමය භාවිතා කරන්නේ නම් LKAS 28 හි විස්තර කර ඇති ක්‍රියා පටිපාටීන්:<br><br>(අ ) ප්‍රථම වතාවට භාවිතාකරු අතීත ව්‍යාපාරික සංයෝජන මුක්තිය පිළිගනු ලබන විට (පරිශිෂ්ඨ ඇ) ආයෝජන අත්පත් කර ගැනීම අදාල කරගන්නා විට.<br><br>(ආ) අස්තිත්වය ප්‍රථම වතාවට එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්ට පෙරාතුව වෙන්වූ මූල්‍ය ප්‍රකාශනයන් පිළිගනු ලැබූවිට, සහ<br><br>(i) එහි පරිපාලක සමාගමට පසුව අස්තිත්වයට ඡේද ඇ16 හි ඇති වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන වලට අදාල කරගත යුතුය. |

| | |
|---|---|
| | (iii) එහි සංගතයට පසුව අස්තිත්වයට ඡේද ඇ17හි ඇති වෙන් වශයෙන් වූ මූලයප්‍රකාශනවල අදාල කරගත යුතුය. |
| ඉ 4 අ | ප්‍රථම වතාවට භාවිත කරන්නාට SLFRS 7හි ඡේද 44අඅ හි දැක්වෙන නියමයන් අදාල කරගත හැකිය. |

**SLFRS 2 - කොටස් පදනම් ගෙවීම්**

වෙනස්කම් නොමැත.

**SLFRS 3 - ව්‍යාපාර සංයෝජන**

වෙනස්කම් නොමැත.

**SLFRS 4 - රක්ෂණ ගිවිසුම්**

වෙනස්කම් නොමැත.

**SLFRS 5 - විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්**

| **ශීර්ෂය** | **විකිණීම සඳහා වූ සැලසුමකට හෝ අයිතිකරුවන්ට බෙදාහැරීමකට සඳහා වූ සැලැස්මකට වෙනස්කම් කිරීම** |
|---|---|
| 26 | අස්තිත්වයක් විසින්: විකිණීම සඳහා තබාගෙන ඇති (හෝ අපහරණ කාණ්ඩයක්) හෝ අයිතිකරුවන් අතර බෙදා හැරීම සඳහා තබාගෙන ඇති සේ වර්ග කළ වත්කමක්, 7-9 ඡේදවල (විකිණීම සඳහා තබාගෙන ඇති) හෝ ඡේද 12අ හි (අයිතිකරුවන්ට බෙදා හැරීම සඳහා තබාගෙන ඇති) සඳහන් නිර්ණායකයින් තව දුරටත් සපුරා නොලබන අතර, අස්තිත්වයට එම වත්කම ( හෝ අපහරණ කාණ්ඩය) විකිණීම සඳහා තබා ඇති සේ හෝ අයිතිකරුවන්ට බෙදාහැරීම සඳහා (පිළිවෙලින්) තබා ඇති සේ වර්ග කිරීම නවතා දැමිය යුතුය. එබඳු සිද්ධීන් වලදී, අස්තිත්වයක් විසින් 26අ ඡේදය අදාල නොවන විට ඡේද 27-29 වල මඟපෙන්වීම් අනුව වෙනස්කම ගිණුම්ගත කළයුතුය. |
| 26 අ | අස්තිත්වයක් විසින් විකිණීම සඳහා තබාගෙන ඇති වත්කමක් (හෝ අපහරණ කාණ්ඩයක්) ඍජුව, අයිතිකරුවන්ට බෙදාහැරීම සඳහා තබාගෙන තිබෙන වත්කමක් ලෙස ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම් හෝ අයිතිකරුවන්ට බෙදා හැරීම සඳහා තබාගෙන ඇති වත්කමක් ඍජුව (හෝ අපහරණ කාණ්ඩයක්) විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම්, එම වර්ගීකරණය මුල් අපහරණ සැලැස්මෙහි අවිච්ඡින්න ක්‍රියාවලියක් ලෙස සැළකිය යුතුය.<br><br>(අ) අස්තිත්වය මෙම වෙනස්කම් ගිණුම්ගත කිරීම සඳහා ඡේද 27-29 හි දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය නොකළ යුතුය. අස්තිත්වය විසින් මෙම SLFRS හි දැක්වෙන වර්ගීකරණය, ඉදිරිපත් කිරීම සහ මැනුම්කරණ අවශ්‍යතාවයන් නව අපහරණ ක්‍රමයට ව්‍යවහාර කළයුතුය.<br><br>(ආ) ජංගම නොවන වත්කම් (හෝ අපහරණ කාණ්ඩයක් ඡේද 15 හි දැක්වෙන නිර්ණායකයන් ප්‍රකාර මැනිය හැකි (විකිණීම සඳහා තබාගෙන ඇති සේ ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම්) සහ යම් අඩුවීමක් 15අ (අයිතිකරුවන් වෙත බෙදාහැරීම සඳහා තබාගෙන ඇති ලෙසට ප්‍රති වර්ගීකරණය කර තිබීම) සහ සාධාරණ අගයෙහි යම් අඩුවීමක් හෝ වැඩිවීමක් හඳුනාගැනීම හෝ ජංගම නොවන වත්කම්වල (හෝ අපහරණ කාණ්ඩයක) විකුණුම් වියදම් අඩුකළ පසු බෙදාහැරීමේ පිරිවැය ඡේද 20-25 හි දැක්වෙන නිර්ණායකයන් අනුව මැනිය යුතුය.<br><br>(ඇ) අස්තිත්වය 8 සහ 12අ ඡේද වලට අනුව වර්ගීකරණ දිනය වෙනස් නොකළ යුතුය.ඡේද 9 හි ඇති කොන්දේසි සපුරා ඇත්නම්, විකිණීම හෝ අයිතිකරුවන් වෙත බෙදාහැරීම සම්පූර්ණ කිරීම සඳහා දී ඇති කාලය දීර්ඝ කිරීමක් වළක්වන්නේ නැත. |
| **27** | අස්තිත්වයක් විසින් විකිණීම සඳහා ලෙස තබාගෙන ඇති සේ හෝ අයිතිකරුවන්ට බෙදාහැරීම සඳහා තබාගෙන ඇති සේ වර්ග කිරීම නවතා දමන ලද (හෝ විකිණීම සඳහා තබාගෙන ඇති සේ හෝ අයිතිකරුවන්ට බෙදාහැරීම සඳහා තබාගෙන ඇති සේ වර්ගීකරණය කළ අපහරණ කාණ්ඩයක |

| | |
|---|---|
| | ඇතුලත්ව තිබීම නවතා දැමූ) ජංගම නොවන වත්කමක් (හෝ අපහරණ කාණ්ඩයක්) පහත සඳහන් දෙවිධියෙන් අඩු අගයට මැනිය යුතුය.<br><br>(අ) වත්කම (හෝ අපහරණ කාණ්ඩය) විකිණීම සඳහා තබාගෙන ඇති සේ හෝ අයිතිකරුවන් වෙත බෙදාහැරීම පිණිස තබාගෙන ඇති සේ වර්ගීකරණය නොකර තිබුනේ නම් එහි ක්ෂයවීම, ක්‍රමක්ෂය හෝ ප්‍රත්‍යාගණනයන් සඳහා යම් ප්‍රමාණයක් හඳුනාගෙන තිබිය හැකිව තිබුණේ නම් ඒ සඳහා ගැලපීම් කරන ලද විකිණීම සඳහා තබාගෙන ඇති සේ හෝ අයිතිකරුවන් වෙත බෙදාහැරීම සඳහා තබාගෙන ඇති සේ වර්ගීකරණය කිරීමට පෙර වත්කමෙහි (හෝ අපහරණ කාණ්ඩයෙහි) ධාරණ අගය. සහ<br><br>(ආ) පසුකාලීනව නොවිකිණීමට හෝ බෙදා නොහැරීමට තීරණය කළ දිනයෙහි එහි *අයකර ගතහැකි අගය.* |
| **28** | අස්තිත්වය විසින් විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස හෝ අයිතිකරුවන් වෙත බෙදාහැරීම පිණිස තබාගෙන ඇති ලෙස වර්ග කිරීම නවතා දමන ලද ජංගම නොවන වත්කමකට අවශ්‍ය වන යම් ගැලපීමක් වේ නම්, එය පිළිවෙලින් 7-9 හෝ 12අ ඡේද වල දැක්වෙන නිර්ණායකයන් තව දුරටත් සපුරනු නොලබන තත්ත්වයට පත්වූ කාලපරිච්ඡේදයෙහි, අඛණ්ඩ සන්තතික මෙහෙයුම් වලින් ලද ලාභයෙහි හෝ අලාභයෙහි ඇතුලත් කළයුතුය. කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි විකිණීම සඳහා තබාගෙන ඇති ලෙසට වර්ගීකරණය, අපහරණ කාණ්ඩය හෝ ජංගම නොවන වත්කම් විකිණීම සඳහා තබාගෙන ඇති ලෙසට හෝ අයිතිකරුවන් වෙත බෙදාහැරීම සඳහා තබාගෙන ඇති ලෙසට වර්ගීකරණය නවතා ඇති පරිපාලිතය, බද්ධ මෙහෙයුම්, බද්ධ ව්‍යාපාර, ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකමෙහි කොටස හෝ ආශ්‍රිත වර්ගීකරණය අනුව සංශෝධනය විය යුතුය. අස්තිත්වය විසින් එම ගැලපීම 37 වන ඡේදයෙහි ප්‍රකාර හඳුනාගනු ලැබූ යම් ලාභයක් හෝ අලාභයක් ඉදිරිපත් කිරීම සඳහා යොදාගනු ලබන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ශීර්ෂයෙහිම ඉදිරිපත් කළයුතුය. |
| **29** | අස්තිත්වයක් විසින් විකිණීම සඳහා තබාගෙන ඇති ලෙසට වර්ගීකරණය කර ඇති අපහරණ කාණ්ඩයකින් තනි වත්කමක් හෝ වගකීමක් ඉවත් කළහොත්, විකිණීම සඳහා ඇති අපහරණ කාණ්ඩයේ ඉතිරි වත්කම් හා වගකීම්, තව දුරටත් කාණ්ඩයක් ලෙස මනිනු ලබන්නේ එම කාණ්ඩය 79 දක්වා ඡේද වල වූ නිර්ණායකයන් සපුරන්නේ නම් පමණි. අස්තිත්වයක් විසින් අයිතිකරුවන් වෙත බෙදාහැරීම සඳහා තබාගෙන ඇති ලෙස වර්ගීකරණය කර ඇති තනි වත්කමක් හෝ වගකීමක් අපහරණ කාණ්ඩයකින් ඉවත් කළහොත්, බෙදාහැරීම සඳහා ඇති අපහරණ කාණ්ඩයේ ඇති ඉතිරි වත්කම් හා වගකීම් තවදුරටත් කාණ්ඩයක් ලෙස මනිනු ලබන්නේ, එම කාණ්ඩය 12අ ඡේදයේ නිර්ණායකයන් සපුරන්නේ නම් පමණි. එසේ නැතහොත්, විකිණීම සඳහා තබාගෙන ඇති ලෙසට (හෝ අයිතිකරුවන් වෙත බෙදැහැරීම සඳහා තබාගෙන ඇති ලෙසට) වර්ග කිරීමට අවශ්‍ය නිර්ණායකයන් තනි තනිව සපුරාලනු ලබන, කාණ්ඩයේ ඉතිරි ජංගම නොවන වත්කම් වෙන වෙනම ගෙන, ඒවායෙහි ධාරණ අගය සහ ඒදිනට සාධාරණ වටිනාකමින් විකිණීම සඳහා වැයවන පිරිවැය (හෝ බෙදාහැරීමේ පිරිවැය) අඩුකළ අගය යන දෙකින් අඩු අගයට මැනිය යුතුය. විකිණීම සඳහා තබාගෙන ඇති ලෙසට වර්ග කිරීමට අවශ්‍ය නිර්ණායකයන් සපුරනු නොලබන ජංගම නොවන වත්කම් කිසිවක් වේ නම් 26 ඡේදය ප්‍රකාරව ඒවා තවදුරටත් එලෙස වර්ග කිරීම නවතා දැමිය යුතුය. අයිතිකරුවන්ට බෙදාහැරීම සඳහා තබා ඇති ලෙස වර්ග කිරීමට අවශ්‍ය නිර්ණායකයන් සපුරනු නොලබන ජංගම නොවන වත්කම් කිසිවක් වේ නම් 26 ඡේදය ප්‍රකාරව ඒවා තවදුරටත් එලෙස වර්ග කිරීම නවතා දැමිය යුතුය. |
| 44 ඕ | 2014 සැප්තැම්බර් මස නිකුත් කරන ලද IABSහි *2012 - 2014 වාර්ෂික වැඩි දියුණු කිරීමේ චක්‍ර පිළිගැනීම*, සංශෝධිත ඡේද 26 - 29 සහ එකතු කරන ලද ඡේද26 අ. අස්තිත්වයක් විසින් එම සංශෝධන LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* අනුව අපහරණ ක්‍රමයෙහි වෙනස්වීම සිදුවන 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදය සඳහා ඉදිරි කාලීනව ව්‍යවහාර කළයුතුය.කලින් ව්‍යවහාරයට අවසර දෙනු ලැබේ. අස්තිත්වයක් විසින් එම සංශෝධන පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |

**SLFRS 6-ඛනිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම**

වෙනස්කම් නොමැත.

**SLFRS 7-මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව්කිරීම**

**පරිශිෂ්ඨ ආ**

| | |
|---|---|
| **21** | LKAS 1 *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙහි*, 117 ඡේදයට අනුකූලව අස්තිත්වයක් විසින් මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීම සඳහා අදාලවන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මැනුම් පදනම (හෝ පදනම්), ඇතැම් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, සහභාවිතා කළ වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරයි. |
| **41 ඞ** | *හෙළිදරව් කිරීම් - මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම*, 2014 දී නිකුත් කරන ලද, (SLFRS 7ට සංශෝධන), එකතු කළ ඡේද 13අ - 13ඊ සහ ආ40 - ආ53. අස්තිත්වයක් එම සංශෝධන 2014 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. අස්තිත්වයක් එම සංශෝධන අතීතානුයෝගීව සැපයිය යුතුය. |
| **44අඅ** | 2014 සැප්තැම්බර් මස නිකුත් කරන ලද, IASBහි *2012 2014 වාර්ෂික වැඩි දියුණු කිරීමේ චක්‍රය* පිළිගැනීම, සංශෝධිත ඡේද 44ඩ සහ ආ30 සහ එකතු කරන ලද ඡේද ආ 30 අ. අස්තිත්වයක් එම සංශෝධන LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි හි විධිවිධාන අනුව 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතු අතර, අස්තිත්වයක් විසින් ප්‍රථම වරට එම සංශෝධන අනුගමනය කරන්නේ නම් ඡේද ආ30 සහ ආ30 අ සංශෝධන, වාර්ෂික කාලපරිච්ඡේදයට පෙර ඉදිරිපත් කරනු ලබන කිසිම කාලපරිච්ඡේදයක් සඳහා අදාල කර ගැනීම අවශ්‍ය නොවේ. ඡේද 44ඩ, ආ30 සහ ආ30 අ ට කර ඇති සංශෝධන කලින් ව්‍යවහාරයට අවසර ඇත. අස්තිත්වයක් විසින් එම සංශෝධන පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| **ආ 5(උ)** | මූල්‍ය වත්කම්වල කොන්දේසි අනුව ගත්කල කල්පසු වූ හෝ හානිකරණය වූ සේ සැළකෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් නැවත සළකා බැලීමට කතිකා කරගත් කළ මූල්‍ය වත්කම් සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය එසේ යලි කතිකා කරගත් කොන්දේසි වලට යටත්ව වියයුතුය.<br><br>අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කිරීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇති අගයන් මත වඩා වැදගත් බලපෑමක් ඇති කරන ඇස්තමේන්තු කිරීම් ඇතුලත් වන ඒවාට අමතරව එහි කළමනාකරණය විසින් කරන ලද විනිශ්චයන්, සැළකිය යුතු අන්දමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ අනෙකුත් සටහන් සමඟ අස්තිත්වය විසින් හෙළිදරව් කිරීමට ද LKAS 1හි 122 ඡේදයෙන් අවශ්‍ය කෙරේ. |
| **ආ 30 අ** | මාරුකිරීමේ කොටසක් ලෙස මූල්‍ය වත්කමට ආවේණික වූ ගිවිසුම්මය අයිතිවාසිකම් හෝ බැඳීම් කිසිවක් අස්තිත්වය විසින් රඳවා තබා නොගෙන මෙන්ම මාරුකරන ලද මූල්‍ය වත්කම හා සම්බන්ධයෙන් අළුත් ගිවිසුම්මය අයිතිවාසිකම් හෝ අත්පත් කරගත නොලබන්නේ නම් අස්තිත්වයකට මාරු කරන ලද මූල්‍ය වත්කමක් කෙරෙහි අඛන්ඩ සම්බන්ධතාවයක් නොමැත. මාරු කරන ලද මූල්‍ය වත්කමෙහි අනාගත කාර්ය සාධනය පිළිබඳව උනන්දුවක් හෝ අනාගතයේදී කුමන තත්ත්වයක් යටතේ හෝ මාරු කළ වත්කම වෙනුවෙන් ගෙවීම් කිරීමට වගකීමක් නොමැති නම් අස්තිත්වයකට මාරුකරන ලද මූල්‍ය වත්කමක් කෙරෙහි අඛන්ඩ සම්බන්ධතාවයක් නැත. මෙහි "ගෙවීම්" යන යෙදීමේදී මාරු කරන ලද මූල්‍ය වත්කමට අදාල අස්තිත්වය එකතු කර ගන්නා මුදල් ප්‍රවාහයන් ඊට ඇතුලත් නොවන අතර අස්තිත්වය විසින් ඒවා පැවරුම්ලාභියා වෙත ප්‍රේෂණය කළයුතුවේ. |
| **ආ 30 අ** | අස්තිත්වයක් මූල්‍ය වත්කමක් මාරු කරන විට එහි සඳහන් වන ගාස්තුවක් උදාහරණ ලෙස, සේවා ගිවිසුමේ ඇතුලත්ව ඇති ගාස්තුවක් අයකර එම මූල්‍ය වත්කම සම්බන්ධව සේවා කිරීමේ අයිතිය අස්තිත්වයට රඳවා ගත හැකිය. හෙළිදරව් කිරීමේ පරමාර්ථ සඳහා සේවා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයට අඛණ්ඩව සම්බන්ධතාවයක් තිබේද නැද්ද යන්න තීරණය කිරීම සඳහා අස්තිත්වය විසින් එම සේවා ගිවිසුම ඡේද 42ඇ සහ ආ30 හි දැක්වෙන මාර්ගෝපදේශ වලට අනුකූලව තක්සේරු කරයි. උදාහරණ ලෙස අය කරන සේවා ගාස්තුව මාරු කල මූල්‍ය වත්කමෙන් රැස්කරගනු ලැබූ මුදල් |

| | |
|---|---|
| | ප්‍රවාහයන්හි මුදල් ප්‍රමාණය හෝ කාල නිර්ණය මත රඳා පවතින්නේ නම් සේවා සැපයුම්කරුට හෙළිදරව් කිරීමේ පරමාර්ථය සඳහා මාරු කළ මූල්‍ය වත්කම කෙරෙහි අඛන්ඩ සම්බන්ධතාවයක් ඇත. එසේම මාරුකරන ලද මූල්‍ය වත්කමෙහි නිශ්ක්‍රීයව පැවතීම හේතුවෙන් ස්ථාවර ගාස්තුව මුළු මනින් නොගෙවනු ලැබුවහොත් එවිට ද හෙළිදරව් කිරීමේ පරමාර්ථ සඳහා සේවා සැපයුම්කරුට මූල්‍ය වත්කම කෙරෙහි අඛන්ඩ සම්බන්ධතාවයක් ඇත. මෙම උදාහරණ වලදී මාරු කරන ලද මූල්‍ය වත්කමෙහි අනාගත කාර්ය සාධනය කෙරෙහි සේවා සැපයුම්කරුට ඇල්මක් ඇත. මෙම තක්සේරු කිරීම සේවා සැපයීම වෙනුවෙන් අස්තිත්වයට ප්‍රමාණවත් ගාස්තුවක් ලැබේද නැද්ද යන්න නොසළකා කරනු ලබන ස්වාධීන එකක් වේ. |

## SLFRS 8 - මෙහෙයුම් ඛණ්ඩ

වෙනස්කම් නොමැත.

## SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

| | |
|---|---|
| **4(ආ)(iv)** | මෙම SLFRSට අනුකූලව පරිපාලිතයන් ඒකාබද්ධ කර ඇති හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරන අගයට මැන තිබෙන එහි අවසාන හෝ අන්තර් මධ්‍ය පරිපාලකය පොදු මහජනතාවගේ භාවිතය සඳහා ලබාගත හැකි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඒවා SLFRS සමග අනුකූල වීම. |
| **4(ආ)** | **[ඉවත් කරන ලදී.]** |
| **4(ඇ)** | **[ඉවත් කරන ලදී.]** |
| **4(අ)** | LKAS 19*සේවක ප්‍රතිලාභ* අදාල වන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් හෝ අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ සැලසුම් වලට මෙම SLFRS අදාල නොවේ. |
| **4 (ආ)** | SLFRS හි 31 ඡේදයට අනුව, එහි සියළුම පරිපාලිතයන් ලාභ හෝ අලාභ සාධාරණ අගයට මෙම මැනුම්කර ඉදිරිපත් කළයුතු ලෙසට දක්වා ඇත්නම්, පරිපාලකය ආයෝජන අස්තිත්වයක් වන විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අවශ්‍යතා නොතකා ඉදිරිපත් කළයුතු නැත. |
| **32** | 31ඡේදයෙහි දැක්වෙන අවශ්‍යතා නොතකා, ආයෝජන අස්තිත්වයක් සතුව පරිපාලිතයක් ඇතිවිට, එය හුදු ආයෝජන අස්තිත්වයක් නොවන සහ එහි ප්‍රධාන පරමාර්ථය සහ ක්‍රියාකාරිත්වය වන්නේ ආයෝජන අස්තිත්වයෙහි, ආයෝජන කටයුතු වලට සේවා සැපයීම හා සම්බන්ධිත කටයුතු වන්නේනම් (ඡේද ආ 85ඇ - ආ85ඉ බලන්න.) එම පරිපාලිතය මෙම SLFRSහි ඡේද 19-26 ට අනුකූලව ඒකාබද්ධ කළයුතු අතර, කවරහෝ එබඳු පරිපාලිතයන් අත්පත් කර ගැනීම සඳහා SLFRS 3 හි නියමයන් අනුගමනය කළයුතුය. |
| **ආ 85 ඇ** | ආයෝජන අස්තිත්වයකට සෘජුව හෝ පරිපාලිතයන් මඟින් තුන්වෙනි පාර්ශවයන්ට මෙන්ම සිය ආයෝජකයිනට ආයෝජන සම්බන්ධිත සේවාවන් (උදා: ආයෝජන උපදේශන සේවාවන්, ආයෝජන කළමනාකරණය, ආයෝජන සහාය සහ පරිපාලන සේවාවන් ) සැපයිය හැකි අතර එම ක්‍රියාකාරකම් අස්තිත්වයට කොතරම් සැළකිය යුතු තරමේ ඒවා වුවද එම අස්තිත්වයට; ආයෝජන අස්තිත්වයක නිර්වචනය දිගටම සපුරාලීමට යටත්ව එම සේවාවන් සැපයිය හැක. |
| **ආ 85 ඈ** | ආයෝජන අස්තිත්වයක් සතුව ආයෝජන අස්තිත්වයක් නොවන හා ඔවුන්ගේ ප්‍රධාන පරමාර්ථය හා කාර්යයන් වන්නේ ආ85ඇ- ආ85ඈ ඡේදවල විස්තර කර ඇති ඒවා වැනි ආයෝජන හා සම්බන්ධ සේවාවන් සැපයීම හෝ ආයෝජන අස්තිත්වය සතු ආයෝජන සම්බන්ධ කටයුතුවලදී අස්තිත්වයට හෝ වෙනත් පාර්ශවයන්ට සේවා සැපයීම නම් 32 ඡේදය ප්‍රකාරව අස්තිත්වය එම පරිපාලිතය ඒකාබද්ධ කළයුතුය. ආයෝජන හා සම්බන්ධ සේවාවන් හෝ ක්‍රියාකාරකම් වල නිරත පරිපාලිතය ආයෝජන අස්තිත්වයක් වන්නේ නම් ආයෝජන අස්තිත්වය විසින් 31 ඡේදය ප්‍රකාරව ලාභ හෝ අලාභ තුලින් සාධාරන අගයට එම පරිපාලිතය මැනිය යුතුය. |

| | |
|---|---|
| ඇ 1 ඈ | *ආයෝජන අස්තිත්වයන් : ඒකාබද්ධ ව්‍යාතිරේක ව්‍යවහාර කිරීම* ( SLFRS 10, SLFRS 12 සහ LKAS 28 සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද, සංශෝධිත ඡේද 4, 32, ආ85ඇ, ආ85ඉ සහ ඇ2අ සහ එකතු කරන ලද ඡේද 4අ - 4ආ. අස්තිත්වයක් මෙම සංශෝධන 2016 ජනවාරි මස 01 දින හෝ ඊටපසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාරය සඳහා අවසර තිබේ. පූර්ව කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධන ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| ඇ 2 අ | LKAS 8 ඡේද 28 හි අවශ්‍යතාවයන් කෙසේ වෙතත්, ප්‍රථම වරට මෙම SLFRS ව්‍යවහාර කරනු ලබන විට සහ ඊට පසුව *ආයෝජන අස්තිත්ව සහ ආයෝජන අස්තිත්ව* : මෙම SLFRS ප්‍රථම වරට අනුගමනය කළවිට ඒකාබද්ධ ව්‍යාතිරේඛ සංශෝධන ව්‍යවහාර කිරීමේදී අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම අවශ්‍ය බව LKAS 8 ඡේද 28 (ඊ) අනුව, SLFRS ව්‍යවහාර කර ගැනීම ආරම්භ වන දිනයට මුලින් වූ ආසන්නතම වාර්ෂික කාලපරිච්ඡේදය (“ආසන්නතම මුලින් එළඹෙන කාලපරිච්ඡේදය”) සඳහා ව්‍යවහාර කළයුතුය. අස්තිත්වයකට මෙම තොරතුරු වර්තමාන කාලපරිච්ඡේදය සඳහා හෝ පූර්ව සන්සන්දනාත්මක කාලපරිච්ඡේද සඳහා ඉදිරිපත් කළහැකි වුවත් එසේ කළයුතු ලෙසට අත්‍යවශ්‍ය කර නොමැත. |

## SLFRS 11 -බද්ධ සැකසුම්

| | |
|---|---|
| 21 අ | අස්තිත්වයක් විසින් SLFRS 3 *ව්‍යාපාර සංයෝජන* යටතේ නිර්වචනය කර ඇති බද්ධ මෙහෙයුම්කාර්යයන් ඇතුලත්ව තිබෙන ව්‍යාපාරයක, බද්ධ මෙහෙයුමක හිමිකමක් අත්පත් කර ගැනීමේදී ඡේද 20 හි නිර්ණායකයන් අනුව,එයට අයත් කොටස සඳහා SLFRS 3 ව්‍යාපාර සංයෝජන ගිණුම්කරණය පිළිබඳ සියළුම අනෙකුත් SLFRSහි ඇති සියළු මූලධර්මයන්ට අනුව එහෙත් මෙම SLFRSහි මාර්ගෝපදේශ වලට පරස්පර විරෝධී නොවන පරිදි සහ ව්‍යාපාර සංයෝජන හා සම්බන්ධයෙන් එම SLFRS මගින් නියම කර ඇති තොරතුරු හෙළිදරව් කිරීම් සිදුකල යුතුය. බද්ධ මෙහෙයුම් කාර්යයන් ඇතුලත්ව ඇති ව්‍යාපාරයක, ආරම්භක හිමිකම් සහ අතිරේක හිමිකම අත්පත් කර ගැනීම යන දෙයාකාරය සඳහාම අනුගමනය කළයුතුය. මෙවැනි බද්ධ මෙහෙයුමක හිමිකම් අත්පත් කර ගැනීම් සඳහා ගිණුම්කරණය ඡේද ආ33අ - ආ33ඈ දක්වා නිශ්චිතව දක්වා ඇත. |
| **ශීර්ෂය** | **බද්ධ මෙහෙයුම්වල හිමිකම් අත්පත් කර ගැනීම් ගිණුම්කරණය** |
| ආ 33 අ | අස්තිත්වයක් විසින් SLFRS 3 හි නිර්වචනය කර ඇති පරිදි, බද්ධ මෙහෙයුම් ක්‍රියාකාරකම ව්‍යාපාරයක් වන බද්ධ මෙහෙයුමක හිමිකම අත්පත් කරගත් විට, ඡේද20 ට අනුකූලව, එයට අයත් කොටස සඳහා පමණක් SLFRS 3 ව්‍යාපාර සංයෝජන ගිණුම්කරණය සහ අනෙකුත් සියළුම SLFRSහි ඇති සියළු මූලධර්මයන්ට අනුව,එහෙත් මෙම SLFRS මාර්ගෝපදේශවලට විරෝධී නොවන පරිදි සහ ව්‍යාපාර සංයෝජන හා සම්බන්ධයෙන් එම SLFRS මගින් නියම කර ඇති තොරතුරු හෙළිදරව් කිරීම් සිදුකල යුතුය. ව්‍යාපාර සංයෝජන ගිණුම්කරණ මූලධර්ම මෙම SLFRSහි ඇතුලත් මාර්ගෝපදේශ වලට පරස්පර නොවන ව්‍යාපාර සංයෝජන ගිණුම්කරණ මූලධර්මවලට පහත සඳහන් දෑ ඇතුලත් වේ (ඒවාට සීමා නොවන).<br><br>(අ) SLFRS 3 සහ අනෙකුත් SLFRS හි දක්වා ඇති ව්‍යාතිරේඛයන් මගින් දක්වා ඇති අයිතම් හැර හඳුනාගත හැකි වත්කම් සහ වගකීම් සාධාරණ අගය මත මැනීම :<br><br>(ආ) ණය හෝ ස්කන්ධ සුරැකුම්පත් නිකුතුවකදී දැරූ පිරිවැය වියදමක් ලෙසට හඳුනාගැනීමට ව්‍යාතිරේඛව LKAS 32 මූල්‍ය සාධන පත්‍ර : ඉදිරිපත් කිරීම සහ SLFRS 9 ට අනුකූලව අත්පත් කර ගැනීම හා සම්බන්ධිත පිරිවැය, වියදම දරණ ලද සහ සේවාවන් ලැබුන කාලය අනුව හඳුනාගත යුතුය.<br><br>(ඇ) SLFRS 3 සහ LKAS 12 ආදායම් බදු මගින් නියමකර ඇති පරිදි ව්‍යාපාර සංයෝජන සඳහා මුල්වරට කීර්ති නාමය හඳුනාගන්නා අවස්ථාවේදී පැනනැගුනු විලම්බිත බදු වගකීම් හැර මුල්වරට වත්කම් හා වගකීම් හඳුනාගැනීමේදී පැනනැගුනු විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හඳුනාගැනීම: |

| | |
|---|---|
| | (ඇ) අත්පත් කරගනු ලැබූ දිනට, අත්පත් කරගනු ලැබූ හඳුනාගත හැකි වත්කම් සහ බාරගත් වගකීම්වල ශුද්ධ ප්‍රමාණය වෙනුවෙන් මාරුකරන ලද ප්‍රතිශ්ඨාවෙහි අතිරික්තයක් ඇත්නම්, එය කීර්තිනාමය ලෙසට හඳුනාගැනීම; (ඉ) කීර්තිනාමය වෙනුවෙන් අවම වශයෙන් වාර්ෂිකව වෙන් කරඇති මුදල් උත්පාදන ඒකකයක් හානිකරණයව ඇති බවට හැඟවීමක් ඇතිවන සෑම විටම, LKAS 36 වත්කම් හානිකරණයෙහි නිර්ණායකයන් අනුව, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය සම්බන්ධයෙන් හානිකරණ පරීක්ෂාවක් සිදුකළ යුතුය; |
| ආ 33 අ | බද්ධ මෙහෙයුමට සම්බන්ධිත පාර්ශවකරුවන්ගෙන් එක් අයෙකු විසින්, එය සැකසීමේදී බද්ධ මෙහෙයුමට දායක වන්නේ නම්, SLFRS 3හි නිර්වචනය කර ඇති පරිදි, පවතින ව්‍යාපාරයක් වන බද්ධ මෙහෙයුමක් නම්, පමණක් නම්, එවිටද ඡේද 21අ සහ ආ33අ අදාල කරගත යුතුය. කෙසේ වුවද, බද්ධ මෙහෙයුමක් සකස් කිරීමේදී ඊට සහභාගීවන්නන් සියළුම දෙනා බද්ධ මෙහෙයුමට දායක වන්නේ ව්‍යාපාරයක් ලෙස ගත නොහැකි වත්කම් හෝ වත්කම් කාණ්ඩ වලින් පමණක් නම් එම ඡේද එවැනි බද්ධ මෙහෙයුමක් සකස් කිරීමට අදාල නොවේ. |
| ආ 33 ඇ | SLFRS 3 හි නිර්වචනය කර ඇති පරිදි,ව්‍යාපාරයක් වන බද්ධ මෙහෙයුම් ක්‍රියාකාරකමක් ඇතිබද්ධ මෙහෙයුමක, ඇතැම්විට බද්ධ මෙහෙයුමක එයට ඇති හිමිකම, බද්ධ මෙහෙයුමෙහි අමතර හිමිකමක් මෙහෙයුම්කරුවෙකු අත්පත් කර ගැනීමෙන් වැඩිකර ගත හැකිය. එවැනි සිදුවීමකදී කලින් බද්ධ මෙහෙයුමෙහි පැවති හිමිකම් බද්ධ මෙහෙයුම්කරු බද්ධ පාලනය රඳවා ගන්නේ නම් යලි මැනීමක් සිදු නොකරනු ඇත. |
| ආ 33 ඈ | පාර්ශවකරුවන් අතර බද්ධ පාලනය හවුලේ ක්‍රියාත්මකවන විටදී, බද්ධ මෙහෙයුමක හිමිකමක් අත්පත් කර ගැනීමේදී, අස්තිත්වය බද්ධ මෙහෙයුමෙහි හිමිකම අත්පත් කර ගැනීමත් ඇතුළුව පාලනය අවසානයේදී, පාර්ශවකරුවන්ගේ පොදු පාලනය හෝ අත්පත් කර ගැනීමට පෙර සහ පසුව හෝ පාර්ශවකරුවන් යන දෙපක්ෂයෙන්ම පත්වන්නේ නම් සහ එම පාලනය මාරු නොවන විට ඡේද 21අ සහ ආ33අ - ආ33ඈ අනුගමනය නොකෙරේ. |
| ඡේද 33 අ (ආ) අධෝ ලිපිය | අස්තිත්වයක් විසින් SLFRS 9 මේ දක්වා ව්‍යවහාර නොකරන නමුත් මෙම සංශෝධන අනුගමනය කරන්නේ නම්, මෙම සංශෝධන වලට SLFRS ට දී ඇති යොමුව LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර : හඳුනාගැනීම සහ මැනීම* යොමුව වශයෙන් කියවිය යුතුය. |
| ඇ1අඅ | 2015 මාර්තු මස නිකුත් කරන ලද බද්ධ මෙහෙයුම් වල හිමිකම අත්පත් කර ගැනීම් (SLFRS 11 සංශෝධන), ඡේද ආ 33 ට පසු සංශෝධිත ශීර්ෂය සහ එකතු කරන ලද ඡේද 21අ, ආ33අ-ආ33ඈ සහ ඇ14අ සහ ඒවායෙහි සම්බන්ධිත ශීර්ෂයන් ගිණුම්ගත කිරීම. අස්තිත්වයක් එම සංශෝධන 2016 ජනවාරි මස 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ඉදිරි කාලීනව ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාර කිරීම සඳහා ද අවසර ඇත. අස්තිත්වයක් විසින් පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා එම සංශෝධන ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. |
| **ශීර්ෂය** | **බද්ධ මෙහෙයුම් වල හිමිකම් අත්පත් කර ගැනීම් ගිණුම්ගත කිරීම** |
| ඇ 14 අ | 2015 මාර්තු මස නිකුත් කරන ලද බද්ධ මෙහෙයුම් වල හිමිකම් අත්පත් කරගැනීම් ගිණුම්ගත කිරීම (SLFRS 11 ට සංශෝධන), ඡේද ආ33 ට පසු ශීර්ෂය සංශෝධනය සහ එකතු කරන ලද ඡේද 21අ, ආ33අ - ආ33ඈ සහ ඇ14අ සහ ඒවායෙහි සම්බන්ධිත ශීර්ෂ: අස්තිත්වයක් එම සංශෝධන බද්ධ මෙහෙයුමේ ක්‍රියාකාරකම් SLFRS 3 හි නිර්වචනය අනුව ව්‍යාපාරයක් ලෙස සැළකිය හැකි බද්ධ මෙහෙයුම්වල හිමිකම් අත්පත් කර ගැනීම් සඳහා ව්‍යවහාර කළයුතු අතර ඒවා ව්‍යවහාර කරන පළමුවන කාලපරිච්ඡේදය ආරම්භයේ සිට සිදුවන අත්පත් කර ගැනීම් සඳහා අස්තිත්වය මෙම සංශෝධන ඉදිරි කාලීනව ව්‍යවහාර කළයුතුය. ඒ හේතුවෙන් බද්ධ මෙහෙයුම් වල කලින් කාලපරිච්ඡේද වලදී හිමිකම් අත්පත් කර ගැනීමේදී හඳුනාගනු ලැබූ අගයන් සඳහා ගැලපුම් නොකළ යුතුය. |

**SLFRS 12 -අනෙකුත් අස්තිත්ව කෙරෙහි ඇති හිමිකම් හෙලිදරව්කිරීම**

| | |
|---|---|
| 6 (ආ)(ii) | කිසියම් ආයෝජන අස්තිත්වයක් විසින් එහි සියළුම පරිපාලිතයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මැණුම්කරණය කොට SLFRS 10 ඡේද 31 ට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට මෙම SLFRS මගින් අවශ්‍ය කෙරෙන පරිදි ආයෝජන අස්තිත්ව පිළිබඳව හෙලිදරව් කිරීම් ඉදිරිපත් කළයුතුවේ. |
| ඇ 1 ඇ | ආයෝජන අස්තිත්ව : ඒකාබද්ධ ව්‍යාතිරේඛය ව්‍යවහාර කිරීම (SLFRS 10, SLFRS 12 සහ LKAS 28 ට වූ සංශෝධන), 2015 මාර්තු මස නිකුත් කරන ලද සංශෝධිත ඡේද6. අස්තිත්වයක් විසින් එම සංශෝධනය 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ව්‍යවහාර කළයුතුය. පූර්ව කාලපරිච්ඡේදයන්ට අදාල කර ගැනීමට ද අවසර ඇත. අස්තිත්වයක්,පූර්ව කාලපරිච්ඡේදයක් සඳහාඑම සංශෝධන ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙලිදරව් කළයුතුය. |

**SLFRS 13 - සාධාරණ අගය මැනුම්කරණය**

වෙනස්කම් නොමැත.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 14**
***නියාමන විලම්බන ගිණුම්***

**පටුන** **ඡේද**


| | |
|---|---|
| **අරමුණ** | **1** |
| **විෂය පථය** | **5** |
| **හඳුනාගැනීම, මැණිම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම** | **9** |
| **ඉදිරිපත් කිරීම** | **18** |
| **හෙළිදරව් කිරීම** | **27** |

**පරිශිෂ්ඨ**

**අ. නිර්වචිත පද**

**ආ. ව්‍යවහාරකරණ උපදේශන**

**ඇ. බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

**ඈ. SLFRS 1 මුල් වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීමට අනුෂංගික සංශෝධන**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 14**

***නියාමන විලම්බන ගිණුම්***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 14 *නියාමන විලම්බන ගිණුම්* (SLFRS 14) මෙහි 1 - 36 දක්වා ඡේදවල සහ පරිශිෂ්ඨ අ - ඈ හි නියම කර ඇත. සෑම ඡේදයකට එක හා සමාන අධිකාරී බලයක් ඇත. තද කළු අකුරෙන් දක්වා ඇති ඡේද වලින් ප්‍රධාන මූලධර්ම සඳහන් කර ඇත. අ පරිශිෂ්ඨයේ නිර්වචනය කර ඇති පද මෙම ප්‍රමිතයේ ප්‍රථම වරට දිස්වෙන විට *ඇල* අකුරු වලින් දක්වේ. අනෙක් පද සඳහා වන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහාවන පාරිභාෂික ශබ්ද සංග්‍රහයේ දී ඇත. මෙම ප්‍රමිතයේ අරමුණ සහ නිගමන සඳහා වූ පදනම *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වූ පූර්විකාව සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ ආකල්පමය ආකෘතිමය රාමුවද* සම්බන්ධ කොට ගෙන කියවිය යුතුය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සඳහාත් ඒවා භාවිත කිරීම සඳහාත් පදනමක් LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් (නිසා) සහ වැරදි* මගින් සැපයේ.

<u>**පරමාර්ථය**</u>

1. අස්තිත්ත්වයක් *ගාස්තු රෙගුලාසිවලට* යටත්වන මිලකට හෝ ගාස්තුවකට ගණුදෙනුකරුවන්ට භාණ්ඩ හෝ සේවා සපයන විටකදී පැන නගින *නියාමන විලම්බන ගිණුම් ශේෂයන්* සඳහා මූල්‍ය වාර්තාකරන අවශ්‍යතාවයන් නියම කිරීම මෙම ප්‍රමිතයේ පරමාර්ථය වේ.

2. මෙම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා, ප්‍රමිතය මගින් පහත දෑ අවශ්‍ය කෙරේ.

(අ) නියාමන විලම්බන ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා කලින් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම (*කලින්* පොපිගිමු GAAP) ප්‍රකාරව ව්‍යවහාර කළ ගිණුම්කරණ මූල ධර්මවලට කරන ලද සීමිත වෙනස්කම්; සහ

(ආ) (i) අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ගාස්තු රෙගුලාසි මගින් පැනනගින වටිනාකම් හඳුනාගැනීම සඳහා පැහැදිලි කිරීම; සහ

(ii) යම් හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂයන්ගෙන් වන අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය, කාල නියමය සහ අනියතතාවය, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයකුට අවබෝධකර ගැනීමට උපකාරී වීම, හෙළිදරව් කිරීම.

3. ඉහත 2 වන ඡේදයේ යොමු කරන ලද සීමිත වෙනස්කම්වලට යටත්ව අස්තිත්ත්වයට එහි විෂය පථය තුළ, එහි මූල්‍ය ප්‍රකාශනවල නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා එහි කලින් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම ප්‍රකාරව ගිණුම් ගත කිරීම දිගටම කරගෙන යාමට, එය SLFRS භාවිතා කරන විට, මෙම ප්‍රමිතයේ අවශ්‍යතා අනුව අස්තිත්වයකට ඉඩදේ.

4. මෙයට අමතරව, මෙම ප්‍රමිතය වෙනත් ප්‍රමිතයන් හි ඇති අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමට හෝ බැහැර කිරීමට ඉඩ සළසා ඇත. නියාමන විලම්බන ගිණුම් ශේෂ වාර්තා කිරීම සඳහා විශේෂයෙන් සඳහන් කර ඇති සියළුම නිශ්චිත අවශ්‍යතාවයන් සහ එම ශේෂයන්ට සම්බන්ධිත වෙනත් ප්‍රමිත වල අවශ්‍යතාවයන් ගෙන් යම් ව්‍යතිරේඛයන් කිරීමක් හෝ නිදහස් කිරීමක් එහි වෙනත් ප්‍රමිතවල අඩංගුවනවා වෙනුවට ඒවා මෙම ප්‍රමිතය තුළ අඩංගු වේ.

**විෂය පථය**

**5. අස්තිත්ත්වයක එහි මුල්ම SLFRS මූල්‍ය ප්‍රකාශන තුළ මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට පහත තත්ත්වයන් සපුරාලන්නේ නම් පමණක් අස්තිත්ත්වයට ඉඩ ලැබේ:**

**(අ) ගාස්තු නියාමන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමක් සහ**

**(ආ) එහි කලින් පොපිගිමු (GAAP) ප්‍රකාරව, එහි මූල්‍ය ප්‍රකාශ තුළ නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස සුදුසුකම් ලබන හඳුනාගත් වටිනාකම්.**

**6. අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට තෝරා ගනිමින් එහි මුල්ම SLFRS මූල්‍ය ප්‍රකාශනයන්හි එය නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගන්නේ නම් පමණක් වනවිටදී අස්තිත්ත්වය එහි පසුව එන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශනවල මෙම ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතුය.**

7. ගාස්තු නියාමන ක්‍රියාකාරකම්වල නිරත වන අස්තිත්ත්වවල වෙනත් පැතිවල ගිණුම්කරණය පිළිබඳව මෙම ප්‍රමිතය අමතන්නේ නැත. මෙම ප්‍රමිතයේ ඇති අවශ්‍යතාවයන් ව්‍යවහාරකරමින්, වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කම් හෝ වගකීම් ලෙස හඳුනාගැනීමට ඉඩදෙන හෝ අවශ්‍ය කරන යම් වටිනාකම් නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස වර්ගීකරණය කරන වටිනාකම් තුළ ඇතුළත් නොකළ යුතුය.

**8. මෙම ප්‍රමිතියේ විෂය පථය තුළ වන හෝ එය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වයක්, එහි සියලුම ගාස්තු නියාමන ක්‍රියාකාරකම් වලින් පැන නගින සියලුම නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා මෙම ප්‍රමිතයේ සියළුම අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතුය.**

**හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම**

**LKAS 8 *ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි හි* 11 වන ඡේදයෙන් තාවකාලික නිදහස් කිරීම්**

**9. ගාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇති සහ මෙම ප්‍රමිතයේ විෂය පථය තුළවන සහ එය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයක්, නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සංවර්ධනය කරන විට LKAS 8 හි 10 සහ 12 වන ඡේද ව්‍යවහාර කළයුතුය.**

10. අයිතමයක් සඳහා පැහැදිලිව ව්‍යවහාර කළයුතුවන අදාළ ප්‍රමිතයක් නොමැතිවිට එම අයිතමය සඳහා ගිණුම් කරන ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමේදී කළමනාකාරිත්වය විසින් සළකා බැලීම අවශ්‍යකරන හෝ එයට ඉඩදෙන අවශ්‍යතාවයන් සහ උපදේශනවල ප්‍රභවයන් LKAS 8 හි 11 - 12 පරිච්ඡේදවලින් නියමකරයි. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම මැනීම හානිකරණ සහ ප්‍රතිහඳුනා ගැනීම සඳහා වන එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා LKAS 8 හි 11 ඡේදය අස්තිත්වයක් ව්‍යවහාර කිරීම, මෙම ප්‍රමිතයෙන් නිදහස් කෙරේ. ඒ නිසාවෙන් ඔවුන්ගේ පෙර පොපිගිමු ප්‍රකාරව එක්කෝ වෙනම අයිතම හෝ වෙනත් වත්කම් හෝ වගකීම් වල ධාරණ වටිනාකමේ කොටසක් ලෙස නියාමන විලම්බන ගිණුම්ශේෂ හඳුනාගන්නා අස්තිත්ව මෙම ප්‍රමිතියේ 18 - 19 ඡේද වලින් අවශ්‍යකරන ඉදිරිපත් කිරීමේ යම් වෙනස්කම්වලට යටත්ව LKAS 8 හි 11 වන ඡේදයෙන් නිදහස් කිරීම් මගින් මෙම ප්‍රමිතය ප්‍රකාරව එම ශේෂ හඳුනාගැනීම දිගටම කරගෙන යෑමට අවසර දේ.

**පවත්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම පවත්වාගෙන යාම**

**11. 13 - 15 ඡේද වලින් අවසර දෙන යම් වෙනස් කිරීම් සඳහා හැර මෙම ප්‍රමිතය මුල්වරට භාවිතා කිරීම තුළ නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම මැනීම, හානිකරණය, ප්‍රතිහඳුනාගැනීම සඳහා කලින් පොපිගිමු ගිණුම් ප්‍රතිපත්ති ව්‍යවහාර කිරීම අස්තිත්ත්වයක් විසින් දිගටම කරගෙන යා යුතුය. කෙසේ වෙතත්, එවැනි වටිනාකම් ඉදිරිපත් කිරීමේදී මෙම ප්‍රමිතයෙන් ඉදිරිපත් කර ඇති අවශ්‍යතාවයන් සමඟ අනුකූල වීම අවශ්‍ය කරන අතර ඒ සඳහා අස්තිත්ත්වයේ කලින් පොපිගිමු ඉදිරිපත් කිරීමේ ප්‍රතිපත්තිවලට වෙනස්කම් කිරීම අවශ්‍ය කෙරේ (18 - 19 ඡේද බලන්න).**

12. 13 - 15 ඡේද වලින් අවසර දෙන වෙනස්කිරීම් සඳහා හැර අස්තිත්ත්වයක් 11 වන ඡේදය ප්‍රකාරව ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති පසුව එළඹෙන කාලපරිච්ඡේදවලදී සංගතව ව්‍යවහාර කළයුතුය.

**ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

**13. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම පටන් ගැනීම සඳහා අස්තිත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් නොකළ යුතුය. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කළ යුත්තේ, එම වෙනස් කිරීම් වලින් මූල්‍ය ප්‍රකාශන, පරිශීලකයන්ගේ ආර්ථික තීරණ ගැනීමේ අවශ්‍යතා වඩාත් අදාළ වන විට සහ එම අවශ්‍යතාවයන් වැඩියෙන් විශ්වසනීය නොවන හෝ අඩුවෙන් විශ්වසනීය නොවනවිට සහ අඩුවෙන් අදාළ නොවන විටදී පමණි. අස්තිත්වය විසින් අදාළත්වය සහ විශ්වසනීයත්වය විනිශ්චය කළ යුත්තේ LKAS 8 හි 10 වන ඡේදයේ ඇති නිර්ණායක භාවිත කිරීමෙනි.**

14. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරිමට LKAS 8 හි ඡේද 10 හෝ 14 - 15 ව්‍යවහාර කිරීමෙන්, අස්තිත්වයන් මෙම ප්‍රමිතය මගින් නිදහස් කරනු නොලැබේ. නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම සාධාරණීය කිරීමට, එම වෙනස් කිරීම් මගින් එහි මූල්‍ය ප්‍රකාශන LKAS 8 හි 10 ඡේදයේ ඇති නිර්ණායක සපුරාලීමට ආසන්න කරන බවට අස්තිත්ත්වයක් විසින් නිරූපණය කළයුතුය. කෙසේ වෙතත් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනා ගැනීම සඳහා වෙනස් කිරීම් වලින් එම නිර්ණායක සමඟ සම්පූර්ණයෙන් අනුකූල වීම අත්කරගැනිම අවශ්‍ය නොවේ.

15. මෙම ප්‍රමිතය මුල් වරට ව්‍යවහාර කිරීම මත වන කරන ලද වෙනස්කම් වලට සහ පසුව එන වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා කරන ලද වෙනස්කම් යන දෙකම සඳහා 13 - 14 ඡේද ව්‍යවහාර වේ.

**වෙනත් ප්‍රමිත සමග අන්තර් ක්‍රියාකාරිත්වය**

**16. වෙනත් ප්‍රමිත සමග මෙම ප්‍රමිතයේ අන්තර් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කිසියම් නිශ්චිත බැහැර කිරීමක්, නිදහස් කිරීමක් හෝ අතිරේක අවශ්‍යතාවයන් මෙම ප්‍රමිතය තුළම අන්තර්ගත වී ඇත. (ආ 7 - ආ 28 ඡේද බලන්න). එවැනි කිසියම් බැහැර කිරීමක්, නිදහස් කිරීමක් හෝ අතිරේක අවශ්‍යතාවයන් නොමැති විටකදී වෙනත් ප්‍රමිත ප්‍රකාරව හඳුන්නා ගන්නා වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට ව්‍යවහාර වන අන්දමට හා සමානව වෙනත් ප්‍රමිත නියාමන විලම්බන ගිණුම් ශේෂයන් සඳහාද ව්‍යවහාර විය යුතුය.**

17. සමහර අවස්ථාවලදී නියාමන විලම්බන ගිණුමක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල උචිත අන්දමින් පිළිඹිබු වීම සඳහා 11 - 12 ඡේද ප්‍රකාරව ස්ථාපනය කරන ලද අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව මනින ලද එම ශේෂය සඳහා වෙනත් ප්‍රමිතයක් ව්‍යවහාර කිරීම අවශ්‍ය විය හැකිය. උදාහරණයක් වශයෙන් අස්තිත්වයකට ගාස්තු නියාමන ක්‍රියාකාරකම් විදේශ රටක තිබිය හැකි අතර ඒ සඳහාවන ගණුදෙනු සහ නියාමන විලම්බන ගිණුම් ශේෂයන් වාර්තා කරන අස්තිත්ත්වයේ භාවිත ව්‍යවහාර මුදල් නොවන ව්‍යවහාර මුදලකින් නම්කර තිබිය හැකිය. නියාමන විලම්බන ගිණුම් ශේෂයන් සහ එම ශේෂයන්ගේ සංචලන LKAS 21 *විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීමෙහි බලපෑම* ව්‍යවහාර කරමින් පරිවර්තනය කරනු ලැබේ.

**ඉදිරිපත් කිරීම**

**ඉදිරිපත් කිරීම වෙනස්වීම්**

18. 11 - 12 ඡේද ප්‍රකාරව හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා 20 - 26 ඡේදවල සාරාංශ ගත කර ඇති ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයන් මෙම ප්‍රමිතය හඳුන්වාදේ.

මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන විටදී, වෙනත් ප්‍රමිත ප්‍රකාරව හඳුනාගන්නා වත්කම් සහ වගකීම් වලට අමතරව නියාමන විලම්බන ගිණුම්ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. මෙම ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවලින්, වෙනත් ප්‍රමිතවල මූල්‍ය වාර්තා කරන අවශ්‍යතාවයන්ගෙන් නියාමන විලම්බන ශේෂයන් හඳුනාගැනීමේ බලපෑම වෙන් කරයි.

19. LKAS 1 *මූල්‍ය ප්‍රකාශන* ඉදිරිපත් කිරීම ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ(යන්) වල ඉදිරිපත් කිරීම අවශ්‍යකරන අයිතමයනට අමතරව, මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන අස්තිත්වයක් 20 - 26 ඡේද ප්‍රකාරව සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලන ඉදිරිපත් කළයුතුය.

**නියාමන විලම්බන ගිණුම් ශේෂ වර්ගීකරණය**

**20. පහත දෑ සඳහා අස්තිත්වයක් වෙන් වෙන් වූ පේළි අයිතම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා ඉදිරිපත් කළයුතුයඃ**

**(අ) සියළුම නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂයන්ගේ එකතුව; සහ**

**(ආ) සියළුම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂයන්ගේ එකතුව.**

**21. අස්තිත්ත්වයක් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම සහ ජංගම - නොවන වත්කම් සහ ජංගම සහ ජංගම - නොවන වගකීම් ලෙස වෙන් වෙන්ව වර්ගීකරණයක් ඉදිරිපත් කරන විටකදී නියාමන විලම්බන ගිණුම් ශේෂයන්ගේ එකතුව ජංගම හෝ ජංගම - නොවන ලෙස වර්ගීකරණය නොකළ යුතුය. ඒ වෙනුවට, නියාමන විලම්බන ගිණුම්ශේෂ ඉදිරිපත් කිරීමට පෙර ලබා ගන්නා, උප එකතුන් භාවිතා කිරීම මගින් වෙනත් ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කරන වත්කම් සහ වගකීම් වලින් 20 වන ඡේදයෙන් අවශ්‍ය කරන වෙන් වෙන් වූ පේළි අයිතම වෙන් කොට හඳුනාගත යුතුය.**

**නියාමන විලම්බන ගිණුම් ශේෂයන්හි සංචලනයන් වර්ගීකරණය කිරීම.**

**22. වාර්තා කරන කාලපරිච්ඡේදය සඳහා වන වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත් අයිතමවලට සම්බන්ධිත සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂ තුළවන ශුද්ධ සංචලනය අස්තිත්වයක් විසින් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, වෙනත් විස්තීර්ණ ආදායම් කොටස තුළ ඉදිරිපත් කළයුතුය. වෙනත් ප්‍රමිත ප්‍රකාරව පහත දක්වෙන අයිතම වලට සම්බන්ධිත ශුද්ධ සංචලන සඳහා වෙන් වෙන් වූ පේළි අයිතම භාවිතා කළයුතුය.**

**(අ) ලාභ හෝ අලාභ ගිණුමට පසුව වර්ගීකරණය කරනු නොලබන; සහ**

**(ආ) නිශ්චිත කොන්දේසි සපුරාලන විට ලාභ හෝ අලාභ ගිණුමට යළි වර්ගීකරනු ලබන.**

**23. අත්කරගත් වටිනාකම් වැනි ලාභ හෝ අලාභ වල පිළිබිඹු නොවන සංචලනයන් හැර වාර්තා කරන ලද කාලපරිච්ඡේදය සඳහා සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂයන් තුළ ඉතිරිව ඇති ශුද්ධ සංචලනය ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ලාභ හෝ අලාභ කොටසේ හෝ වෙන්ව වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙන්ව වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වයක් ඉදිරිපත් කළයුතුය. නියාමන විලම්බන ගිණුම් ශේෂවල ශුද්ධ සංචලනයට පෙර ලබාගන්නා උප එකතූන් භාවිතා කිරීම මගින් වෙනත් ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කරන ආදායම් සහ වියදම් වලින් මෙම වෙන් වූ පේළි අයිතම වෙන්කොට හඳුනාගත යුතුය.**

24. නියාමන විලම්බන ගිණුම්ශේෂ හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් විලම්බිත බදු වත්කමක් හෝ බදු වගකීමක් හඳුනාගන්නා විට, එහි ප්‍රතිඵලයමත විලම්බිත බදු වත්කම (වගකීම) සහ එම විලම්බිත බදු වත්කම (වගකීම) සම්බන්ධිත සංචලනයන් සමඟ සම්බන්ධිත නියාමන විලම්බිත බදු ශෙෂයන් අස්තිත්වය විසින්, LKAS 12 *ආදායම් බදු* ප්‍රකාරව විලම්බිත බදු වත්කම් (වගකීම්) සහ බදු වියදම් (ආදායම්) ((අ) 9 - ආ 12 ඡේද බලන්න) සඳහා ඉදිරිපත් කළ එකතුව තුළ එය වෙනුවට ඉදිරිපත් කළයුතුය.

25. SLFRS 5 *විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්* ප්‍රකාරව අස්තිත්වයක් අසන්තතික මෙහෙයුමක් හෝ අපහරණ කණ්ඩායමක් ඉදිරිපත් කරන විට අපහරණ කණ්ඩායම හෝ අසන්තතික මෙහෙයුම් තුළ ඉදිරිපත් කරනවා වෙනුවට අස්තිත්වය විසින් අදාළ වන පරිදි යම් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල ශුද්ධ සංචලනය නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලන සමඟ ඉදිරිපත් කළයුතුය (ආ 19 - ආ 22 ඡේද බලන්න).

26. LKAS 33 *කොටසක ඉපයුම ප්‍රකාරව* අස්තිත්වයක් *කොටසක ඉපයුම* ඉදිරිපත් කරන විට, නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනයන් බැහැර කර LKAS 33 මගින් අවශ්‍ය කරන ඉපයීම් වටිනාකම් භාවිතාකර ගණනය කරන අමතර මූලික සහ තනුක කොටසක ඉපයීම අස්තිත්වයක් විසින් ඉදිරිපත් කළයුතුය. (ආ 13 - ආ 14 ඡේද බලන්න)

## හෙළිදරව් කිරීම

### පරමාර්ථය

**27. මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයක් පරිශීලකයනට එය තක්සේරු කිරීම පහසුවීමේ කාර්ය සඳහා පහත තොරතුරු හෙළිදරව් කළයුතුය.**

**(අ) අස්තිත්වයක් සපයන භාණ්ඩ හෝ ලබාදෙන සේවා සඳහා ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගත හැකි මිල (මිල ගණන) ස්ථාපනය කරන ගාස්තු රෙගුලාසිවල ස්වභාවය සහ ඒ හා ආශ්‍රිත අවදානම්; සහ**

**(ආ) එහි මූල්‍ය තත්ත්වයට, මූල්‍ය කාර්ය සාධනයට, සහ මුදල් ප්‍රවාහවලට එම ගාස්තු රෙගුලාසි නිසාවන බලපෑම්**

28. 27 වන ඡේදයේ පරමාර්ථ ඉෂ්ඨකර ගැනීමට, 30 - 36 ඡේදවල නියම කර ඇති හෙළිදරව් කිරීම් වලින් යම් කිසිවක් අදාළ යයි සැලකිල්ලට නොගන්නේ නම් ඒවා මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරිය හැකිය. 27 වන ඡේදයේ වන පරමාරථය ඉටු කර ගැනීමට 30 - 36 ඡේද ප්‍රකාරව ලබාදී ඇති හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, එම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කරන අතිරේක තොරතුරු අස්තිත්වය විසින් හෙළිදරව් කළයුතුය.

29. 27 වන ඡේදයේ හෙළිදරව් කිරීමේ පරමාර්ථය ඉටුකර ගැනීමට, අස්තිත්වයක් විසින් පහත දැක්වෙන සියල්ලම සැලකිල්ලට ගතයුතුය.

(අ) හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය කරන විස්තරවල මට්ටම;

(ආ) විවිධ අවශ්‍යතාවයන් ගෙන් සෑම එකක් මත කොපමණ ප්‍රමාණයකට අවධාරණය තැබිය හැකි ද;

(ඇ) කොපමණ ප්‍රමාණයකට සමාහරණය හෝ කොටස්වලට විසුරුවා හැරීම භාර ගත යුතුද; සහ

(ඈ) හෙළිදරව් කරන ලද ප්‍රමාණාත්මක තොරතුරු ඇගයීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට අමතර තොරතුරු අවශ්‍ය වේද?

**ගාස්තු නියාමනයට යටත් ක්‍රියාකාරකම් පහදා දීම**

30. අස්තිත්වයේ ගාස්තු රෙගුලාසි ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ඒ හා ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීමට, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට උපකාරී වීමට අස්තිත්වයක් සෑම වර්ගයකම ගාස්තු නියාමන ක්‍රියාකාරකම් සඳහා පහත දෑ හෙළිදරව් කළයුතුය;

(අ) ගාස්තු නියාමන ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ නියාමන ගාස්තු නියම කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය පිළිබඳව කෙටි විස්තරයක්

(ආ) ගාස්තු නියමකරන්නා(නන්) හඳුනාගැනිම. ගාස්තු නියමකරන්නා සම්බන්ධිත පාර්ශවයක් නම් (LKAS 24 *සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීමෙහි* නිර්වචනය කර ඇති පරිදි) එම කරුණ, සම්බන්ධිත පාර්ශවයක් වන්නේ කෙසේද යන්නත් සමඟ අස්තිත්වය හෙළිදරව් කළයුතුය.

(ඇ) සෑම පන්තියකම (එනම් සෑම වර්ගයකම පිරිවැය හෝ ආදායම) නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂය අනාගතයේදී අයකර ගැනීම හෝ සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂය ප්‍රතිවර්තනය කිරීමේ අවදානම් සහ අනියතාවය කෙසේ බලපාන්නේද? උදාහරණ වශයෙන්;

(i) ඉල්ලුමේ අවදානම (උදාහරණ වශයෙන් පාරිභෝගිකයන්ගේ ආකල්පවල වෙනස්වීම, විකල්ප සැපයුම් ප්‍රභවයන් තිබීම හෝ තරගකාරීත්වයේ මට්ටම)

(ii) නියාමන අවදානම (උදාහරණ වශයෙන්, ගාස්තු නියම කිරීමේ අයදුම්පත් ඉදිරිපත් කිරීම හෝ අනුමැතිය හෝ අපේක්ෂිත අනාගත නියාමන ක්‍රියාකාරකම් පිළිබඳ අස්තිත්වයේ තක්සේරුව); සහ

(iii) වෙනත් අවදානම් (උදාහරණ වශයෙන්, ව්‍යවහාර මුදල් හෝ වෙනත් වෙළඳපොළ අවදානම්)

31. 30 වන ඡේදයෙන් අවශ්‍යකරන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම එක්කෝ මූල්‍ය ප්‍රකාශන සටහන්වල සෘජුව හෝ මූල්‍ය ප්‍රකාශන වල භාෂිතය හා සමාන භාෂිතයක් ඇති එම වේලාවටම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට ලබාගත හැකි කළමනාකාරීත්ව විවරණ හෝ අවදානම් වාර්තා වැනි හරස් යොමු වලින් මූල්‍ය ප්‍රකාශනවල සිට වෙනත් සමහර ප්‍රකාශනයක අන්තර්ගතකර දියයුතුය. තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සෘජුව හෝ හරස් යොමු මගින් අන්තර්ගත කර නොමැති නම් මූල්‍ය ප්‍රකාශන අසම්පූර්ණය.

**හඳුනාගත් වටිනාකම් පැහැදිලි කිරීම**

32. නියාමන විලම්බන ගිණුම් ශේෂ අයකර ගැනීම සඳහා තක්සේරු කළේ සහ යම් හානිකරන අලාභයක් වෙන් කරනු ලැබුවේ කෙසේද යන්න ඇතුළුව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම සහ ප්‍රතිහඳුනාගැනීමේ පදනම සහ මුල් වරට සහ පසුව ඒවා මනිනු ලැබුයේ කෙසේද යන්න අස්තිත්ත්වය හෙළිදරව් කළයුතුය.

33. සෑම වර්ගයකම ගාස්තු නියාමන ක්‍රියාකාරකමක් සඳහා, සෑම පන්තියක නියාමන විලම්බන ගිණුම් ශේෂය සඳහා අස්තිත්වයක් පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළයුතුය;

(අ) වෙනත් ආකෘතියක් වඩා යෝග්‍ය වන්නේ නම් හැර, වගුවක ආකාරයෙන් කාලපරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ ධාරන වටිනාකම්වල සැසඳුමක් අවශ්‍ය කරන විස්තර වල මට්ටම තීරණය කිරීමේදී අස්තිත්ත්වය විසින් විචාර බුද්ධිය ව්‍යවහාර කළයුතුය (28- 29 ඡේද බලන්න) එහෙත් පහත සඳහන් සංරචක සාමාන්‍යයෙන් අදාළ වනු ඇත.

(i) ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස හඳුනාගෙන ඇති වටිනාකම්;

(ii) ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළදී ශේෂයන්ට සම්බන්ධිත අය කරගත් (සමහර විට ක්‍රමක්ෂය ලෙස විස්තර කරන) හෝ ප්‍රතිවර්තනය කළ, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ (යන්හි) හඳුනාගත් වටිනාකම්; සහ

(iii) හානිකරණය, ව්‍යාපාර සංයෝජනයකදී අත්කර ගත් හෝ බාරගත්, බැහැර කරන ලද අයිතම්, හෝ විදේශ විනිමය අනුපාත හෝ වට්ටම් අනුපාතිකවල වෙනස්වීම්වල බලපෑම් වැනි නියාමන විලම්බන ගිණුම් ශේෂ ආරූඪ කරගත් වෙන්ව හඳුනාගනු ලැබූ අනෙකුත් වටිනාකම්.

(ආ) සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම් ශේෂවලට සුදුසු මුදලේ කාලවටිනාකම පිළිඹිබු වීමට භාවිතා කළ ප්‍රතිලාභ අනුපාතිකය හෝ වට්ටම් අනුපාතිකය (ව්‍යවහාර වන කල්හි, ශුන්‍ය අනුපාතිකය හෝ අනුපාතික පරාසයක් ඇතුළුව); සහ

(ඇ) සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂයන්ගේ ධාරන වටිනාකම අය කර ගැනීමට (හෝ ක්‍රම ක්ෂය කිරීමට) හෝ සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂ ප්‍රතිවර්තා කිරීමට අස්තිත්වය අපේක්ෂා කරන කාලය මත ඉතිරිව ඇති කාලපරිච්ඡේදය.

34. අස්තිත්ත්වයේ ආදායම් බදු වියදමේ (ආදායම) වටිනාකමට සහ කාල සැකසුමට ගාස්තු නියාමනය බලපානවිට, ප්‍රවර්තන හා විලම්බිත බද්දේ හඳුනාගත් වටිනාකම් මත ගාස්තු නියාමනයේ තද බලපෑම අස්තිත්ත්වය විසින් හෙළිදරව් කළයුතුයි. එම බදුකරණයට සම්බන්ධිත සහ එම ශේෂයට සම්බන්ධිත සංචලනය වන යම් නියාමන විලම්බන ගිණුම් ශේෂ මෙයට අමතරව අස්තිත්ත්වය විසින් වෙන්ව හෙළිදරව් කළයුතුය.

35. SLFRS 12 *වෙනත් අස්තිත්ත්වවල අයිතිය හෙළිදරව් කිරීම* ප්‍රකාරව ගාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇති පරිපාලිතයක, ආශ්‍රිතයක හෝ බද්ධව්‍යාපාරයක අයිතිය සඳහා සහ මෙම ප්‍රමිතය ප්‍රකාරව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගන්නා අස්තිත්ත්වය හෙළිදරව් කිරීම් ලබාදෙන විට, අස්තිත්ත්වය විසින් හෙළිදරව් කර ඇති අයිතිය සඳහා නියාමන විලම්බන ගිණුම් හර සහ බැර සඳහා සහ එම ශේෂවල ශුද්ධ සංචලනය සඳහා ඇතුළත් කර ඇති වටිනාකම් හෙළිදරව් කළයුතුය. (ආ 25 - ආ 28 ඡේද බලන්න)

36. නියාමන විලම්බන ගිණුම් ශේෂයක් තවදුරටත් සම්පූර්ණයෙන්ම අයකරගත නොහැකි හෝ ප්‍රතිවර්තා කිරීමට නොහැකි යයි අස්තිත්ත්වයක් නිගමනය කරන විට, අස්තිත්ත්වය විසින් එම කරුණ, එසේ අයකර ගැනීමට නොහැකි වීමට හෝ ප්‍රතිවර්තා කිරීමට නොහැකිවීමට හේතු සහ කොපමණ වටිනාකමකින් නියාමන විලම්බන ගිණුම් ශේෂ අඩුවී ඇත්දැයි යන්න හෙළිදරව් කළයුතුය.

**අ පරිශිෂ්ඨය**

**නිර්වචිත පද**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

| | |
|---|---|
| **මුල් SLFRS මූල්‍ය ප්‍රකාශන** | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) සමඟ අනුකූලවන බව ඉතා පැහැදිලි සහ කොන්දේසි රහිත ප්‍රකාශනයන් මගින් අස්තිත්ත්වයක් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත භාවිත කරමින් ඉදිරිපත් කරන මුල් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන |
| **මුල් වරට භාවිත කරන්නා** | එහි මුල් SLFRS මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අස්තිත්ත්වය |
| **කලින් පොපිගිමු** | SLFRS භාවිතා කිරීමට වහාම පෙර මුල්වරට භාවිතා කරන්නෙක් භාවිත කළ ගිණුම්කරණ පදනම |
| **ගාස්තු නියාමන ක්‍රියාකාරකම්** | ගාස්තු රෙගුලාසි වලට යටත් අස්තිත්වයක ක්‍රියාකාරකම් |
| **ගාස්තු රෙගුලාසි** | භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් අයකරගත හැකි මිල ගණන් ස්ථාපනය කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවක්, සහ එම ආකෘතිමය රාමුව ගාස්තු නියාමක මගින් අනුමැතියට සහ/ හෝ සුපරීක්ෂණයට යටත් වේ. |
| **ගාස්තු නියාමක** | අස්තිත්වයක් බැඳෙන ගාස්තුව හෝ ගාස්තු පරාසයක් ස්ථාපනය කරන ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් බලගැන්වෙන අනුමත මණ්ඩලයක්. ගාස්තු නියාමක තුන්වන පාර්ශව මණ්ඩලයක් හෝ ගණුදෙනුකරුවන්ගේ යහපත සහ අස්තිත්වයේ සමස්ථ මූල්‍ය ස්වශක්තතාවය තහවුරු කිරීම යන කරුණු දෙකම සඳහා ගාස්තු නියම කිරීමට ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් මණ්ඩලය කළ යුතු වන්නේ නම් අස්තිත්වයේ ස්වකීය පාලන මණ්ඩලයද ඇතුළුව අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශ්වයක් විය හැකිය. |
| **නියාමන විලම්බන ගිණුම් ශේෂය** | වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගනු නොලබන කිසියම් වියදම් (හෝ ආදායමක්) ගිණුමක ශේෂය, එහෙත් එය ගණුදෙනුකරුවන්ගෙන් අය කර ගත හැකි ගාස්තු (ව) ගාස්තු නියාමක ස්ථාපනය කිරීමෙන් එය දැනටමත් ඇතුළත් වී හෝ ඇතුලත් කිරීමට අපේක්ෂා කරන නිසා එය විලම්බනය සඳහා සුදුසුකම් ලබයි. |

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාර කිරීමේ උපදේශ**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

***ගාස්තු - නියාමන ක්‍රියාකාරකම්***

ආ1 ඓතිහාසිකව ගාස්තු රෙගුලාසි අස්තිත්වයක සියළුම ක්‍රියාකාරකම් සඳහා ව්‍යවහාර වේ. කෙසේ වෙතත්, අත්සන්කර ගැනීම, විවිධාංගකරණය, පාලන රීති සහ සීමා ඉවත් කිරීමත් සමග නියාමනය වන සහ නියාමනය නොවන යන දෙවර්ගයේම ක්‍රියාකාරකම් අස්තිත්ත්වයකට තිබීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ක්‍රියාකාරකම් වලින් කොටසකට පමණක් දනට මිල රෙගුලාසි ව්‍යවහාර විය හැකිය. අස්තිත්ත්වයේ හෝ කර්මාන්තයේ අයත් වන්නේ කුමන වර්ගයටද යන්න නොසළකා ව්‍යවස්ථාපිත හෝ නියාමන සීමාකිරීම් වලට යටත්වන ගාස්තු නියාමන ක්‍රියාකාරකම් වලට පමණක් ගාස්තු නියාමකගේ ක්‍රියාමාර්ග මගින් මෙම ප්‍රමිතය ව්‍යවහාර වේ.

ආ2 ස්වයං නියාමනයවන ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර නොකළ යුතුය. එනම් මිල නියාමකයකු විසින් අධීක්ෂණයකරන සහ/ හෝ අනුමත කරන මිල නියම කිරීමේ ආකෘතිමය රාමුවකට යටත් නොවන ක්‍රියාකාරකම්. පහත දෑ වෙනුවෙන් අස්තිත්වයකට මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට සුදුසු වීමෙන් වළක්වනු නොලැබේ.

(අ) ගණුදෙනුකරුවන්ගේ යහපත සහ අස්තිත්වයේ සමස්ථ මූල්‍ය ස්වශක්තතාවය තහවුරු කිරීම යන කරුණු දෙක සඳහා නියම කරන ලද මිල කිරීමේ ආකෘතිමය රාමුවක් තුළ අස්තිත්වයේ ස්වකීය පාලක මණ්ඩලය හෝ සම්බන්ධිත පාර්ශවයක් ගාස්තු ස්ථාපනය කිරීම; සහ

(ආ) එම ආකෘතිමය රාමුව ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් බලගැන්වෙන අනුමත මණ්ඩලයක සුපරීක්ෂණයට සහ/ හෝ අනුමැතියට යටත් වීම.

**පවතින ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම පවත්වාගෙන යාම**

ආ3 මෙම ප්‍රමිතියේ අරමුණු සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂයන් නිර්වචනය කරන්නේ වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා නොගනු ලබන කිසියම් වියදම් (හෝ ආදායම්) ගිණුමක ශේෂය, එහෙත් එය ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගත හැකි ගාස්තු(ව) ගාස්තු නියාමක සථාපනය කිරීමෙන් එය දනටමත් ඇතුළත් වී හෝ ඇතුළත් කිරීමට අපේක්ෂාකරන නිසා එය විලම්බන කිරීමට සුදුසුකම් ලබන ලෙසය. සමහර වියදම් (ආදායම්) අයිතම නියාමනය කළ ගාස්තුවෙන් (වලින්) බාහිරවිය හැකිය. උදාහරණ වශයෙන් එම වටිනාකම් මිල නියාමක විසින් පිළිගැනීමට අපේක්ෂා නොකරන නිසා හෝ ඒවා ගාස්තු රෙගුලාසි විෂය පථය තුළ නොවන නිසාවිය හැකිය. ඒ නිසාවෙන් එවැනි අයිතමයක් ධාරණ අගයට වත්කමක් හෝ වගකීමක් ලෙස ඇතුළත් කිරීමට වෙනත් ප්‍රමිතයකින් අවශ්‍යකරන්නේ නම් හෝ ඉඩ දෙන්නේ නම් හැර ඒවා දරණ ලද ආදායමක් හෝ වියදමක් ලෙස හඳුනාගැනේ.

ආ4 කලින් පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව එක්කෝ වෙනම වූ හෝ වෙනත් පේළි අයිතම් තුළ ඇතුළත් කර ඇති දේපල පිරියත සහ උපකරණ වැනි හඳුනාගත විය හැකි නියාමන විලම්බන ගිණුම් ශේෂ, සමහර අවස්ථාවන්හිදී වෙත් ප්‍රමිත මගින් අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගැනීමෙන් පැහැදිලිව වළක්වයි. කෙසේ වෙතත් මෙම ප්‍රමිතයේ 11 වන ඡේදය ප්‍රකාරව එහි මුල් SLFRS මූල්‍ය ප්‍රකාශණයේ මෙම ප්‍රමිතය භාවිතා කිරීමට තෝරාගන්නා අස්තිත්වයක් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රති-හඳුනාගැනීම සඳහා එහි කලින් පොපිගිමු ව්‍යවහාර කිරීම දිගටම කරගෙන යාම පහසු වීමට LKAS 8 හි 11 වන ඡේදයෙන් නිදහස් කිරීම ව්‍යවහාර කරයි. එවැනි ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට උදාහරණ වශයෙන් පහත පරිචයන් ඇතුළත් විය හැකිය;

(අ) අස්තිත්ත්වයක ඉඩදිය හැකි පිරිවැය (එනම් පිරිවැය අයකර ගැනිමට ලබාදෙන අපේක්ෂා කරන නියාමන ගාස්තුව) අයකර ගැනීමට පහසු වීම සඳහා අනාගත කාලපරිච්ඡේදවලදී මිල නියාමකගේ විද්‍යාමාන හෝ අපේක්ෂිත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, අස්තිත්ත්වයට අයිතියක් ඇතිවිට නියාමන විලම්බන හර ගිණුම් ශේෂ හඳුනාගැනීම;

(ආ) අනාගත ගාස්තු මගින් අයකර ගැනීමට හෝ ප්‍රතිවර්ත්‍ය කිරීමට අපේක්ෂිත දේපොළ, පිරියත උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් යන අයිතමයන් දෙකෙහිම බැහැර කිරීමෙන් හෝ විශ්‍රාම ගැනීම මත වන යම් ප්‍රතිලාභයක් හෝ අලාභයකට සමාන වටිනාකමක් නියාමන විලම්හන හර හෝ බැර ගිණුම් ශේෂයක් ලෙස හඳුනා ගැනීම;

(ඇ) අනුමත ඉඩදිය හැකි පිරිවැය වැඩියෙන් අයකර ගැනීම (එනම් මිල නියාමක නියමකරන ලද අයකර ගත හැකි වටිනාකම්වලට වැඩිපුර වන ප්‍රමාණය) ප්‍රතිවර්ත්‍ය කිරීම සඳහා අනාගත කාලපරිච්ඡේදවලදී ගාස්තු

අඩු කිරීම, ගාස්තු නියාමකගේ විද්‍යාමාන සහ අපේක්ෂිත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් විසින් හඳුනාගැනීම අවශ්‍යකරන නියාමන විලම්බන බැර ගිණුම් ශේෂ හඳුනා ගැනීම; සහ

(ඇ) මිල නියාමක විසින් නියම කරන ලබන පොලී හෝ වට්ටම් අනුපාතිකයක් භාවිතා කර; නියාමන විලම්බන ගිණුම් ශේෂ වට්ටම් නොකරන ලද හෝ වට්ටම් කරන ලද පදනමක් මත මැනීම.

ආ5 ගාස්තු නියාමකයන් ගාස්තු - නියම කිරීමේ තීරණයන්හිදී ඉඩදිය හැකි පිරිවැයවල වර්ගයන්ට උදාහරණ පහතවන අතර, එබැවින් අස්තිත්වයක් ඒවා නියාමන විලම්බන ගිණුම් ශේෂයන්වල හඳුනාගනු ලැබිය හැකිය;

(i) පරිමා හෝ ගැණුම් මිල විචලන;

(ii) අනුමත කළ 'හරිත බලශක්ති' මුල පිරීම් (LKAS 16 *දේපළ, පිරියත උපකරණ* ප්‍රකාරව දේපළ පිරියත සහ උපකරණ වල පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනය කළ වටිනාකමට වඩා අමතර ප්‍රමාණය);

(iii) ගාස්තු නියාමන අරමුණ සඳහා ප්‍රාග්ධන පිරිවැය ලෙස සැලකෙන සෘජුව ආරෝපණය නොවන පිරිවැය (එහෙත් LKAS 16 ප්‍රකාරව දේපළ, පරියත සහ උපකරණ අයිතමයක පිරිවැය ලෙස අඩංගු කිරීමට ඉඩ නොදෙන පිරිවැය)

(iv) ව්‍යාපෘති අවලංගු කිරීමේ පිරිවැය;

(v) කුණාටු වලින් වන හානි පිරිවැය; සහ

(vi) සැලකෙන පොලී (අරමුදල් සඳහා ඉඩදුන් වටිනාකම් ඇතුළුව හිමිකරුවන්ගේ ස්කන්ධය සහ ණයට ගැනීම් සඳහා අස්තිත්ත්වයට ප්‍රතිලාභයක් ගෙන දෙන ඉදිකිරීම් කාලය තුළදී භාවිත කළ අරමුදල).

ආ6 නියාමන අරමුණු සඳහා ආදායම් හෝ වියදම් අයිතම හඳුනාගැනීම සහ එම අයිතම මූල්‍ය වාර්තාකරන අරමුණු සඳහා හඳුනාගැනීම අතර කාලය වෙනස්වීම් නියාමන විලම්බන ගිණුම් ශේෂවලින් සාමාන්‍යයෙන් නියෝජනය වේ. මුල්වරට SLFRS භාවිත කිරීම මත හෝ නව හෝ සංශෝධිත ප්‍රමිතයක් මූලිකව ව්‍යවහාරකරණය මත අස්තිත්වයක් ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කරන විට, නව හෝ සංශෝධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ ඇතිකරන නව හෝ සංශෝධිත කාලය වෙනස්වීම් පැනනැගිය හැකිය. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම ආරම්භ කිරීමට හැකි වීම පිණිස, අස්තිත්ත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම් වළක්වාලන 13 වන ඡේදයේ තහනම් කිරීම්, SLFRS මගින් අවශ්‍ය කරන ගිණුම් කරන ප්‍රතිපත්තිවල වෙනත් වෙනස් කිරීම් නිසා ඇතිකරවන නව හෝ සංශෝධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම තහනම් නොකෙරේ. මෙසේ වන්නේ එවැනි කාල වෙනස්වීම් සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම 11 ඡේදය ප්‍රකාරව ව්‍යවහාර කළ පවතින හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය සමග සංගත විය හැකි සහ නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම නියෝජනය නොවිය හැකි නිසාත්ය. ඒ හා සමානව SLFRS වෙත සංක්‍රාන්ති වීමට වහාම පෙර නොපැවති කාලය වෙනස්විමෙන් පැන නැගුන නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම 13 ඡේදය තහනම් නොකරන නමුත් 11 වන ඡේදය ප්‍රකාරව ස්ථාපනය කළ අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රමිත සමග සංගතවේ (උදාහරණ වශයෙන් කුණාටු හානි පිරිවැය).

**වෙනත් ප්‍රමිතවල අදාළත්වය**

ආ7 මෙම ප්‍රමිතයේ විෂයපථය තුළවන සහ එහි අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයකට නියාමන විලම්බන ගිණුම් ශේෂයන් හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් නොකඩවා පෙර පොපිගිමු ගිණුම් ප්‍රතිපත්ති ව්‍යවහාර කළයුතුය. කෙසේ වෙතත් සමහර අවස්ථාවන්හිදී නියාමන විලම්බන ගිණුම්ශේෂ උචිත අන්දමින් මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වීමට හැකිවනු පිණිස වෙනත් ප්‍රමිතද ව්‍යවහාර කිරීම අවශ්‍ය විය හැකි බව 16 - 17 ඡේදවල සඳහන් වේ. මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් සමග වෙනත් සමහර ප්‍රමිත අන්‍යෝන්‍යව ක්‍රියාකරන්නේ කෙසේද යන්න පහත සඳහන් ඡේද සාරාංශ ගත කරයි. වෙනත් ප්‍රමිත වලට නිශ්චිත බැහැර කිරීම් සහ ඒවායින් නිදහස් කිරීම් සහ අදාළ වේ යයි අපේක්ෂිත අමතර ඉදිරිපත් කිරීම් සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම පහත සඳහන් ඡේදවලින් පැහැදිලි කෙරේ.

**LKAS 10 *වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිද්ධීන් ව්‍යවහාරකරණය***

ආ8 අස්තිත්වයකට එහි නියාමන විලම්බන ගිණුම්ශේෂ හඳුනාගැනීමට සහ මැනීමට ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය විය හැකිය. වාර්තා කරන කාලපරිච්ඡේද අවසානය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය දෙන දින අතර සිදුවන සිද්ධීන් සඳහා එම සිද්ධීන් පිළිබිඹු වීමට එම ඇස්තමේන්තු සහ උපකල්පන ගැලපිය යුතුද යන්න හඳුනාගැනීමට අස්තිත්වය LKAS 10 ව්‍යවහාර කළයුතුය.

## LKAS 12 *ආදායම් බදු ව්‍යවහාරකරණය*

ආ9 සියළුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීමක් සහ (සමහර කොන්දේසි වලට යටත්ව) විලම්බිත බදු වත්කමක් සමහර සීමිත ව්‍යතිරේක සහිතව අස්තිත්වයක් හඳුනා ගැනීමට LKAS 12 න් අවශ්‍ය කෙරේ. හඳුනා ගතයුතු ආදායම් බදු වටිනාකම හඳුනාගැනීමට එහි ගාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇතුළුව, ගාස්තු නියාමන අස්තිත්වයක් සිය සියළුම ක්‍රියාකාරකම් සඳහා LKAS 12 ව්‍යවහාර කළයුතුය.

ආ10 සමහර ගාස්තු නියාමන යෝජනා ක්‍රමයන්හි, අස්තිත්වයේ ආදායම් බදු වියදම් කොටසක් හෝ සියල්ලම අයකර ගැනීමට හැකිවීම පිණිස අස්තිත්වයට එහි අනාගත ගාස්තු වැඩි කිරීමට ගාස්තු නියාමක අවසර දීම, හෝ අස්තිත්වයෙන් අපේක්ෂා කෙරේ. එවන් අවස්ථාවලදී 11 - 12 ඡේද ප්‍රකාරව ස්ථාපනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ආදායම් බදු වලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂයක් අස්තිත්වයට හඳුනාගැනීම මෙහි ප්‍රතිඵලයක් විය හැකිය. ආදායම් බදු වලට සම්බන්ධ මෙම නියාමන විලම්බන ගිණුම් ශේෂය හඳුනාගැනීම මගින්ම, අමතර තාවකාලික වෙනස්කමක් ඇතිවිය හැකි අතර ඒ සඳහා අමතර විලම්බිත බදු වටිනාකමක් හඳුනාගනු ඇත.

ආ11 LKAS 12 හි ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්හි කෙසේ සඳහන් වුවද නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් විලම්බිත බදු වත්කමක් හෝ විලම්බිත බදු වගකීමක් අස්තිත්වයක් හඳුනාගන්නා විට එම විලම්බිත බදු වටිනාකම්, මුළු විලම්බිත බදු වත්කම් (වගකීම) ශේෂ තුළ අස්තිත්වය විසින් ඇතුලත් නොකළ යුතුය. ඒ වෙනුවට, නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින විලම්බන බදු වත්කම් (වගකීම) එක්කෝ;

(අ) නියාමන විලම්බන හර හෝ බැර ශේෂ සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම සමඟ; හෝ

(ආ) සම්බන්ධිත නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ ළඟින් වෙන් වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වය ඉදිරිපත් කළයුතුය.

ආ12 ඒ හා සමානව නියාමන විලම්බිත ගිණුම් ශේෂ හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින විලම්බිත බදු වත්කමක (වගකීමක් ) සංචලනය අස්තිත්වයක් හඳුනාගන්නා විට LKAS 12 ප්‍රකාරව ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ (වල) ඉදිරිපත්කරන බදු වියදම් (ආදායම්) පේළි අයිතමය තුළ, එම විලම්බිත බදු වටිනාකමේ සංචලනය අස්තිත්වය ඇතුළත් නොකළ යුතුය. ඒ වෙනුවට නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින විලම්බිත බදු වත්කම් (වගකීම්) වල සංචලනය එක්කෝ;

(අ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන (යන්) හි ඉදිරිපත් කරන නියාමන විලම්බන ගිණුම්වල සංචලනයන් සඳහා වන පේළි අයිතම සමඟ; හෝ

(ආ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන(යන්) හි ඉදිරිපත් කරන විලම්බන ගිණුම්වල සංචලනය, සම්බන්ධ පේළි අයිතම ළඟින් වෙන්ව වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වය ඉදිරිපත් කළයුතුය.

## LKAS 33 *කොටසක ඉපයීම ව්‍යවහාරකරණය*

ආ13 අස්තිත්වයක් දිගටම පවත්වා ගෙන යන මෙහෙයුම් සහ පරිපාලක අස්තිත්වය සාමාන්‍ය ස්කන්ධ දරන්නන් හට ආරෝපිත ලාභ හෝ අලාභ වලින් යන දෙකෙන්ම වන කොටසක මූලික සහ තනුක ඉපයීම ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීරණ ආදායම ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීමට සමහර අස්තිත්වවලට LKAS 33 හි 66 වන ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරේ. අමතරව අසන්තතික මෙහෙයුමක් වාර්තා කරන අස්තිත්වයක්, අසන්තතික මෙහෙයුම සඳහා කොටසක මූලික සහ තනුක ප්‍රමාණය එක්කෝ ලාභ හෝ අලාභ හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හෝ සටහන්වල හෙළිදරව් කිරීම LKAS 33 හි 68 වන ඡේදය අවශ්‍ය කෙරේ.

ආ14 LKAS 33 ප්‍රකාරව ඉදිරිපත්කළ සෑම කොටසක ඉපයීම් වටිනාකම (ප්‍රමාණය) සඳහා නියාමන විලම්බන ගිණුම්වල ශේෂවල ශුද්ධ සංචලනය එම ප්‍රමාණවලින් (වටිනාකම්) ඉවත් කර, ඊහා සමාන ආකාරයටම ගණනය කරන අතිරේක මූලික සහ තනුක කොටසක ඉපයීම් ප්‍රමාණය මෙම ප්‍රමිතය ව්‍යවහාරකරණ අස්තිත්ත්වයක් ඉදිරිපත් කළයුතුය. LKAS 33, 73 ඡේදයේ ඇති අවශ්‍යතාවයන් සමඟ සංගතව ඉදිරිපත් කළ සෑම කාලපරිච්ඡේදයක් සඳහාම මෙම ප්‍රමිතයේ 26 වන ඡේදයෙන් අවශ්‍ය කරන කොටසක ඉපයීම ඉදිරිපත් කිරීම හා සමාන අන්දමින් කැපී පෙනෙන පරිදි LKAS 33 න් අවශ්‍යකරන කොටසක ඉපයීම අස්තිත්වයක් ඉදිරිපත් කළයුතුය.

**LKAS 36** ***වත්කම් හානිකරණය ව්‍යවහාරකරණය***

ආ15 අස්තිත්ත්වයක් හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ, හඳුනාගැනීම මැනීම සහ යම් හානිකරනයක් ප්‍රතිවර්ත්‍ය කිරීම සඳහා එහි පෙර පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම ව්‍යවහාර කිරීම අස්තිත්ත්වයකට 11 - 12 ඡේදවලින් අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් වෙනම වූ හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා LKAS 36 ව්‍යවහාර නොවේ.

ආ16 කෙසේ වෙතත් නියාමන විලම්බන ගිණුම් ශේෂ ඇතුළත් මුදල් උත්පාදන ඒකකයකට (මුඋඒ - CGU) හානිකරණ පරීක්‍ෂණයක් ක්‍රියාත්මක කිරීමට අස්තිත්ත්වයකට LKAS 36 මගින් අවශ්‍ය විය හැකිය. මෙම පරීක්‍ෂාව අවශ්‍ය විය හැක්කේ මුඋඒ යේ කීර්තිනාමය අඩංගු වීම හෝ LKAS 36 හි විස්තර කර ඇති හඳුනාගත් හානිකරණ දර්ශකයන් එකක් හෝ ඊට වැඩිගණනක් මුඋඒ සම්බන්ධවීම නිසාය. එවන් අවස්ථාවන්හිදී, මුඋඒ අයකරගත හැකි වටිනාකම සහ ධාරණ වටිනාකම හඳුනාගැනීම සඳහා වන අවශ්‍යතාවයන් LKAS 36 හි 74 - 79 ඡේදවල අඩංගු වේ. හානිකරණ පරීක්‍ෂණයේ අරමුණ සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂ ඕනෑම එකක් මුඋඒ ධාරණ වටිනාකමේ අඩංගු දැයි තීරණය කිරීමට අස්තිත්ත්වයක් එම අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතුය. මෙම පරීක්‍ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් හඳුනාගත් ඕනෑම හානිකර අලාභයක් සඳහා LKAS 36 ඉතිරි අවශ්‍යතාවයන් ඊළඟට ව්‍යවහාර කළයුතුය.

**SLFRS 3** ***ව්‍යාපාර සංයෝජනය ව්‍යවහාරකරණය***

ආ17 SLFRS 3 හි ප්‍රධාන මූලධර්මය වනුයේ ව්‍යාපාරයක් අත්පත් කරගන්නා, අත්පත්කරගත් වත්කම් සහ භාරගත් වගකීම් හඳුනා ගන්නේ ඒවායේ අත්පත් කරගත් දින සාධාරණ වටිනාකම්වලටය. SLFRS 3 හි හඳුනාගැනීමේ සහ මැනීමේ මූලධර්මවලට සීමිත ව්‍යතිරේඛයන් ලබාදෙයි. මෙම ප්‍රමිතයේ ආ 18 ඡේදයෙන් අතිරේක ව්‍යතිරේඛ ලබාදෙයි.

ආ18 නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම්, මැනීම්, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි පෙර පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති අස්තිත්ත්වයන් දිගටම ව්‍යවහාර කිරීම 11-12 ඡේදවලින් අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන්, අස්තිත්ත්වයක් ව්‍යාපාරයක් අත්පත්කර ගන්නේ නම්, එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ, අත්පත් කරගත් දින අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම සහ මැනීම සඳහා 11 - 12 ඡේද ප්‍රකාරව ස්ථාපනය කළ එහි ගිණුම් ප්‍රතිපත්ති අස්තිත්ත්වය ව්‍යවහාර කළයුතුය. අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම ශේෂ සිය ස්වකීය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නේද යන්න නොසළකා අත්පත් කර ගන්නාගේ ප්‍රතිපත්ති ප්‍රකාරව, අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම් ශේෂ අත්පත් කරගත්තා සේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය.

**SLFRS 5** ***විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම් ව්‍යවහාරකරණය.***

ආ19 නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි පෙර ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම ව්‍යවහාර කිරීමට 11 - 12 ඡේදවලින් අස්තිත්ත්වයට අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන්, හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා SLFRS 5 හි මැනීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

ආ20 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය(යන්) හි අසන්තතික මෙහෙයුම් සඳහා තනි වටිනාකමක් ඉදිරිපත් කළයුතු බව SLFRS 5 හි 33 ඡේදයෙන් අවශ්‍ය කෙරේ. එම ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේවුවද, මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වය අසන්තතික මෙහෙයුමක් ඉදිරිපත් කරනවිට, අසන්තතික මෙහෙයුමේ මිල නියාමන ක්‍රියාකාරකම් වලින් පැනනැගි නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය SLFRS 5 හි 33 වන ඡේදයෙන් අවශ්‍යකරණ පරිදි වන පේළි අයිතම් තුළ ඇතුලත් නොකළ යුතුය. ඒ වෙනුවට අසන්තතික මෙහෙයුම් මිල නියාමන ක්‍රියාකාරකම් වලින් පැනනැගි නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය එක්කෝ;

(අ) ලාභ හෝ අලාභ වලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම තුළ; හෝ

(ආ) ලාභ හෝ අලාභ වලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය සඳහා ඉදිරිපත් කරන සම්බන්ධිත පේළි අයිතම ළඟින් වෙන්ව වූ පේළි අයිතමයක් ලෙෂ අස්තිත්වය ඉදිරිපත් කළයුතුය.

ආ21 එසේම, SLFRS 5 හි 38 වන ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වුවද, අස්තිත්වයක් අපහරණ කණ්ඩායමක් ඉදිරිපත් කරනවිට, අපහරණ කණ්ඩායමේ කොටසක්වන නියාමන විලම්බන ගිණුම් හර ශේෂයන්ගේ සහ බැර ශේෂයන්ගේ එකතුව SLFRS 5 හි 38 වන ඡේදයෙන් අවශ්‍ය කරන පරිදිවන පේළි අයිතම තුළ අස්තිත්ත්වය ඇතුළත් නොකළ

යුතුය. ඒ වෙනුවට අපහරණ කණ්ඩායමේ කොටසක්වන නියාමන විලම්බන ගිණුම් හර ශේෂයන්ගේ සහ බැර ශේෂයන්ගේ එකතුව එක්කෝ;

(අ) නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම තුළ; හෝ

(අ) වෙනත් නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ ළඟින් වෙන් වූ පේළි අයිතමයක් ලෙස

අස්තිත්වය ඉදිරිපත් කළයුතුය.

ආ22 අපහරණ කණ්ඩායමට හෝ අසන්තතික මෙහෙයුමකට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලනයන් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් පේළි අයිතමවල ඇතුළත් කිරීමට අස්තිත්වයක් තෝරාගත හොත්, මෙම ප්‍රමිතයේ 33 වන ඡේදය මගින් විස්තර කර ඇති නියාමන විලම්බන පේළි අයිතම වල විශ්ලේෂණයේ කොටසක් ලෙස ඒවා වෙනම හෙළිදරව් කිරීම අවශ්‍ය විය හැකිය.

**SLFRS 10** ***ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ*** **LKAS 28** ***ආශ්‍රිතයන්හි ආයෝජන සහ බද්ධ ව්‍යාපාර ව්‍යවහාරකරණය***

ආ23 SLFR 10 19 වන ඡේදයෙන් "පරිපාලකයක් සමාන ගණුදෙනු සහ ඒ හා සමාන තත්ත්වයන්හිදී වෙනත් සිද්ධීන් සඳහා ඒකාකාර ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිත කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතුය" යන්න අවශ්‍ය කෙරේ. මෙම ප්‍රමිතයේ විෂය පථය තුළවන සහ එය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වයකට, මෙම ප්‍රමිතයේ 8 වන ඡේදය අස්තිත්ත්වයේ සියලුම මිල නියාමන ක්‍රියාකාරකම් වලින් පැන නගින සියලුම නියාමන විලම්බන ගිණුම් ශේෂවලට එහි සියලුම අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීම අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් මෙම ප්‍රමිතය ප්‍රකාරව පරිපාලකයක් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගන්නේ නම්, එහි සියලුම පරිපාලිතයන් ගෙන් පැනනගින නියාමන විලම්බන ගිණුම් ශේෂ වලට එම ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කළයුතුය. මෙම ශේෂ පරිපාලිත ඔවුන්ගේ ස්වකීය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නේ ද යන්න නොසලකා මෙය ව්‍යවහාර කළයුතුය.

ආ24 එලෙසම ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කරමින් LKAS 28 හි 35 - 36 ඡේද වලින් ''සමාන ගණුදෙනු සහ ඒ හා සමාන තත්ත්වයන්හිදී වෙනස් සිද්ධීන් සඳහා ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර අස්තිත්තවයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වීම'' අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා, ආයෝජනය කරනු ලබන අස්තිත්වය ඒ දෑ සමඟ අනුගත වීමට ස්කන්ධ ක්‍රමය ව්‍යවහාරකරන ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයේ ඒවා බවට පත් කිරීමට ඒවායේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට ගැළපුම් කළයුතුය.

**SLFRS 12** *වෙනත් අස්තිත්ත්වවල අයිතිය හෙළිදරව් කිරීම* ව්‍යවහාරකරණය

ආ25 වාර්තා කරන අස්තිත්වයට ප්‍රමාණාත්මකවන එහි පාලනය නොවන හිමිකම ඇති සෑම පරිපාලිතයක් සඳහාම වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ පරිපාලිතයේ පාලනය නොවන හිමිකමට වෙන්කළ ලාභය හෝ අලාභය අස්තිත්වයක් හෙළිදරව් කිරීම SLFRS 12 හි 12 (ඉ) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. මෙම ප්‍රමිතය ප්‍රකාරව විලම්බන නියාමන ගිණුම් ශේෂ හඳුනාගන්නා අස්තිත්වයක් SLFRS 12 හි 12 (ඉ) ඡේදයෙන් හෙළිදරව් කිරීමට අවශ්‍ය කරන වටිනාකම් තුළ වන නියාමන විලම්බන ගිණුම් ශේෂවල ශුද්ධ සංචලනය හෙළිදරව් කළයුතුය.

ආ26 වාර්තාකරණ අස්තිත්වයට ප්‍රමාණාත්මකවන එහි පාලනය නොවන හිමිකම ඇති සෑම පරිපාලිතයක් සඳහාම SLFRS 12 ආ 10 ඡේදයේ නිශ්චය කර ඇති පරිදි පරිපාලිතය සම්බන්ධ සාරාංශගත කළ මූල්‍ය තොරතුරු අස්තිත්වය හෙළිදරව් කිරීම SLFRS 12 හි 12(උ) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. එමෙන්ම වාර්තා කරන අස්තිත්ත්වයට ප්‍රමාණාත්මක සෑම බද්ධ ව්‍යාපාරයක් සහ ආශ්‍රිතයක් සඳහා SLFRS 12, ආ 12 - ආ 13 ඡේදවල නිශ්චය කර ඇති පරිදි සාරාංශ ගත කළ මූල්‍ය තොරතුරු අස්තිත්ත්වයක් හෙළිදරව් කිරීමට SLFRS 12 හි 21 (ආ)(ii) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. SLFRS 12 හි 21 (ඇ) ඡේදය ප්‍රකාරව තනි තනිව ගත් කළ ප්‍රමාණාත්මක නොවන සියළු වෙනත් ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාර සඳහා අස්තිත්වය හෙළිදරව් කළයුතු සාරාංශගත මූල්‍ය තොරතුරු SLFRS 12 හි ආ 16 ඡේදයෙන් නියම කෙරේ.

ආ27 SLFRS 12 හි 12, 21, ආ 10, ආ 12- ආ 13 සහ ආ 16 ඡේදවලින් පැහැදිලිව සඳහන් කර ඇති තොරතුරුවලට අමතරව, මෙම ප්‍රමිතය ප්‍රකාරව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගන්නා අස්තිත්ත්වයක්, නියාමන විලම්බන ගිණුම් හර ශේෂවල එකතුව, නියාමන විලම්බන ගිණුම් බැර ශේෂවල එකතුව සහ SLFRS 12 හෙළිදරව් කිරීම් අවශ්‍යකරණ සෑම අස්තිත්ත්වයක් සඳහා ලාභ හෝ අලාභ වල හඳුනාගත් වටිනාකම් සහ වෙනත් විස්තීරණ ලාභයේ හඳුනාගත් වටිනාකම් අතර කඩා වෙන්කර එම ශේෂවල ශුද්ධ සංචලනයද හෙළිදරව් කළයුතුය.

ආ28 පරිපාලිතයක පාලනය අහිමිවීම මත SLFRS 10 හි 25 ඡේදය ප්‍රකාරව ගණනය කළ ප්‍රතිලාභයක් හෝ අලාභයක් අස්තිත්ත්වයක් හඳුනාගන්නා විට, අස්තිත්ත්වය හෙළිදරව් කිරීමට අවශ්‍ය කරන තොරතුරු SLFRS 12 , 19 වන ඡේදයේ පැහැදිලිව සඳහන් කර ඇත. SLFRS 12 හි 19 වන ඡේදයෙන් අවශ්‍ය කරන තොරතුරුවලට අමතරව, මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්ත්වයක් කලින් පරිපාලිතයේ පාලනය අහිමිවන දින නියාමන විලම්බන ගිණුම් ශේෂ ප්‍රතිහඳුනාගැනීමේදී එයට ආරෝපණය වූ එම ප්‍රතිලාභය සහ අලාභවල කොටස හෙළිදරව් කළයුතුය.

**ඇ පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

*මෙම පරිශිෂ්ඨය මෙම ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

බලාත්මක දිනය

ඇ1 අස්තිත්ත්වයක් එහි මුල් වාර්ෂික SLFRS මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ 2016 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේදයක් සඳහා නම් මෙම ප්‍රමිතය ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාරයට අවසර දේ. ඊට කලින් කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය එහි මුල් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ අස්තිත්ත්වය හෙළිදරව් කළයුතුය.

01 - 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.